# වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම්-2018

**සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය**

මෙම වාර්තාව **2002** සැප්තැම්බර් **12** දිනැති අංක **402** දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ

අවශ්‍යතා සපුරාලීම පිණිස සකස් කරන ලදි.

# අන්තර්ගතය


| | | |
|---|---|---|
| | දැක්ම, මෙහෙවර | i |
| | අමාත්‍යාංශයේ කාර්යයන් | ii |
| | | පිටු අංකය |
| **පරිච්ඡේදය 1 - අමාත්‍යාංශයේ ව්‍යුහය** | | |
| 1.1 | හැඳින්වීම | 1 |
| 1.2 | අමාත්‍යාංශයේ අංශ | 4-13 |
| **පරිච්ඡේදය 2 –සංවර්ධන ක්‍රියාකාරකම්** | | |
| 2 | සංචාරක සංවර්ධනය | 14 |
| 2.5 | අමාත්‍යාංශයේ සංචාරක සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති | 16 |
| 2.5.1. | සංචාරක ආකර්ෂණය සංවර්ධනය කිරීම | 17 |
| 2.5.2. | ප්‍රජා සත්කාරක ගම්මාන වැඩසටහන | 24 |
| 2.5.3. | සංචාරක ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය කිරීම | 26 |
| 2.5.4 | සංචාරකයින් වැඩිපුර ගැවසෙන ස්ථාන ආශ්‍රිත දුම්රිය ස්ථාන නවීකරණය කිරීම | 29 |
| 2.5.5. | බලකොටු 06 ක් සංවර්ධනය කිරීම | 31 |
| 2.5.6. | සංචාරක හිතකාමී ටුක් ටුක් වැඩසටහන | 33 |
| 2.5.7. | ඉහළ සංචාරක ආකර්ෂණයක් සහිත ප්‍රදේශවල සංචාරක පොලීසි ව්‍යාප්ත කිරීම | 34 |
| 2.5.8. | මන්නාරම් මඩු දේවස්ථානයේ සංක්‍රමණ නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීම | 34 |
| 2.5.9. | අලෙවිකරණ සංවර්ධන පහසුකම් (MDF) | 35 |
| 2.6 | වනජීවී අංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති | 36 |
| **පරිච්ඡේදය 3 –මූල්‍ය ප්‍රගතිය** | | |
| 3.1 | මූල්‍ය කාර්යසාධනය -2018 | 37-43 |
| **පරිච්ඡේදය 4 – අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය** | | |
| 4.1 | හඳුන්වාදීම හා කාර්යසාධනය | 44-46 |

වගු


| වගු අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| 2.1 | සංචාරක කාර්යසාධනය -2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා | 14 |
| 2.2 | සංචාරකයින්ගේ පැමිණීමේ ප්‍රමුඛතම වෙළඳපොළ 10 | 15 |
| 2.3 | සංවර්ධන ව්‍යාපෘති -2018 | 16 |
| 2.4 | සංචාරක ආකර්ෂණ ව්‍යාපෘති සංවර්ධනය | 17-22 |
| 2.5 | ත්‍රෛමාසික සත්කාරක සේවා පුහුණු වැඩසටහනේ සාරාංශයක් | 27 |
| 2.6 | සංචාරක සේවා සපයන්නන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන (තෙදින) -2018 | 28 |
| 2.7 | ව්‍යාපෘතිවල විශේෂ අවස්ථා | 29 |
| 3.1 | විසර්ජන පනත අනුව මුළු ප්‍රතිපාදන සහ එහි උපයෝජනය-2018 | 37 |
| 3.2 | මුළු ප්‍රතිපාදන | 38 |
| 3.3 | ව්‍යාපෘති අනුව මුළු ප්‍රතිපාදනය | 38 |
| 3.4 | මුළු ව්‍යාපෘති භාවිතයේ උපයෝජනය | 38 |
| 3.5 | වත්කම් කළමනාකරණය | 39 |
| 3.6 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | 39 |
| 3.7 | වර්ෂය තුල නිකුත් කල අත්තිකාරම් සහ ණය පිළිබඳ විස්තරය | 39 |
| 3.8 | මූල්‍ය ප්‍රගතිය සාරාංශය 2018-12-31 දිනට | 40 |
| 3.9 | ව්‍යාපෘති අනුව මූල්‍ය ප්‍රගතිය -2018 | 40-42 |
| 3.10 | වත්කම් කළමනාකරණය | 42 |
| 3.11 | රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් බී ගිණුම | 43 |
| 3.12 | ණය හා අත්තිකාරම් ගිණුම්වල සාරාංශය | 43 |


ප්‍රස්තාර


| ප්‍රස්තාර අංකය | විස්තරය | පිටු අංකය |
|---|---|---|
| 1.2 | නිර්දේශ කරන ලද වීසා බලපත්‍ර ප්‍රමාණය | 6 |
| 2.1 | විදේශ විනිමය උත්පාදකයක් ලෙස සංචාරක ව්‍යාපාරයේ වර්ධනය (ඇ.ඩො.මිලියන) | 15 |

## දැක්ම  (සංචාරක හා වනජීවී)

මතකයේ රැදෙන , අව්‍යාජ සහ විවිධත්ව අත්දැකීම් සඳහා ලොව විශිෂ්ටතම දූපත ලෙස හඳුනාගැනීම.

## මෙහෙවර (සංචාරක හා වනජීවී)

ශ්‍රී ලංකාවේ ස්වභාවික සහ සංස්කෘතික උරුමය පිළිබිඹු කරනු ලබන සමාජමය වශයෙන් පිළිගන්නා, පරිසරයට වගකියනු ලබන සහ ප්‍රජාවන්ට සහ රටට ආර්ථික ප්‍රතිලාභ අත්පත් කර දෙන අතිවිශේෂ අත්දැකීම් ලබාදෙන ඉහළ වටිනාකමක් සහිත ගමනාන්තයක් බවට පත්වීම.

## දැක්ම (ක්‍රිස්තියානි ආගමික කටයුතු)

"ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ප්‍රජාවගේ ආගමික සහ අධ්‍යාත්මික සංවර්ධනය"

## මෙහෙවර (ක්‍රිස්තියානි ආගමික කටයුතු)

සමාජ පිළිගැනීම සමඟ ක්‍රිස්තියානි සංස්කෘතියේ අගයන්, ආචාර දර්ම සහ විශ්වාස ප්‍රචලිත කිරීම.

**සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය**
**(අංක 2103/33 - 2018 දෙසැම්බර් 28 සිකුරාදා)**

**කාර්යයන් හා කර්තව්‍යයන්**

1. සංචාරක සංවර්ධන,වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු විෂයයට සහ අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. සංචාරක කර්මාන්තය පිලිබඳ ජාතික ප්‍රතිපත්තියට අනුකූලව සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම සහ ප්‍රමිතීන් සම්පාදනය කිරීම.
3. සංචාරක නියෝජිතායතන ලියාපදිංචි කිරීම සහ නියාමන කටයුතු
4. විවේකය ගතකිරීම සඳහා විනෝදාත්මක පහසුකම් සැපයීමට අදාළ කටයුතු ප්‍රවර්ධනය කිරීම.
5. ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා සංරක්ෂණය, උද්භිද උද්‍යාන නඩත්තුව සහ මල්වගා කර්මාන්තය වැඩිදියුණු කිරීම.
6. සිව්පාවුන්, පක්ෂීන් සහ උරගයින් ආදී විවිධ සතුන් ඒකරාශී කිරීම සහ ප්‍රදර්ශනය කිරීමට අදාළ කටයුතු
7. වනජීවී සම්පත් සංරක්ෂණය
8. වනජීවී ආරක්ෂිත ප්‍රදේශයන්හි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයේදී අදාළ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම අවධාරණය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
9. වඳවී යාමේ තර්ජනයට මුහුණ පාන සත්ත්ව වර්ගයන්හි අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතිය හා ඊට අදාළ කටයුතු
10. සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම සඳහා ආගමික වටිනාකම් ජනතාව තුළ වර්ධනය කරනු පිණිස ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.
11. ක්‍රිස්තියානි ආගමික කටයුතු සම්බන්ධයෙන් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.
12. අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු
13. අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනයන් අධීක්ෂණය කිරීම.

**අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන**

1. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
2. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
3. ශ්‍රී ලංකා ප්‍රදර්ශන හා සම්මේලන කාර්යාංශය
4. ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය
5. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
6. ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
7. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
8. වනජීවී භාරය
9. ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව

# පරිච්ඡේදය 1

## අමාත්‍යාංශයේ ව්‍යුහය

# 1. අමාත්‍යාංශය පිළිබඳ දළ විස්තරය

## 1.1 හැඳින්වීම

සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය ලෙස මෙයට පෙර ස්ථාපිත කරන ලද අමාත්‍යාංශය අධිස්ථාපනය කරමින් අංක 2103/33 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් 2018 දෙසැම්බර් මස 28 වන දින සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය පිහිටුවන ලදී. සංචාරක අංශය භාර අමාත්‍යාංශයක් ස්ථාපිත කිරීමේ ප්‍රධාන අරමුණු අතර නිසි ප්‍රතිපත්තියක් හා නියාමන රාමුවක් සැකසීම, ප්‍රබල යටිතල පහසුකම් සංවර්ධනයක් සහතිකවීම, සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සහ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කර ඇති අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල පරිපාලන හා මූල්‍ය විශ්ලේෂණ පවත්වාගෙන යාම වේ.

අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පහත සඳහන් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන ක්‍රියාත්මක වේ.

- ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
- ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
- ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය

නැවත ස්ථාපිත කිරීමත් සමඟම, වනජීවී භාරය ද ඇතුළත්ව පහත සඳහන් දෙපාර්තමේන්තු අමාත්‍යාංශයේ පාලනය යටතට එකතු කරන ලදී.

- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව


අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව 79 ක් වන අතර 2018.12.31 දිනට අමාත්‍යාංශයේ වර්තමාන සේවක සංඛ්‍යාව 71 කි. රාජ්‍ය පරිපාලන හා ආපදා කළමණාකරණ අමාත්‍යාංශය මඟින් පිරවිය යුතු ජ්‍යෙෂ්ඨ, තෘතියික හා ද්විතීයික මට්ටම්වල සේවක සංඛ්‍යා පුරප්පාඩු ගණන 08 කි.

**අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව (සංචාරක අංශය)**

| අංකය | කාර්ය මණ්ඩලය | අනුමත සේවක සංඛ්‍යාව | වර්තමාන සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| **1** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 16 | 15 | 01 |
| **2** | තෘතියික මට්ටම | 04 | 03 | 01 |
| **3** | ද්විතීය මට්ටම | 37 | 31 | 06 |
| **4** | ප්‍රාථමික මට්ටම | 22 | 22 | - |
| | **එකතුව** | **79** | **71** | **08** |

## සංවිධාන ව්‍යුහය*- සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

### සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අංශය





කෙටි යෙදුම්: තොසතානි- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී, සනි-සංවර්ධන නිලධාරී, සස- සංවර්ධන සහකාර, රාකස-රාජ්‍ය කළමනාකරණ සහකාර, නිඡායි-නිෂ්පාදිත ඡායාරූප ශිල්පී, විවියෝ කැමරා ක්‍රියාකරු, විකැස-විඩියෝ කැමරා ක්‍රියාකරු සහායක, ගිස-ගිණුම් සහකාර, තොසතාස-තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර, කාසේස-කාර්යාල සේවක සහායක

*රාජ්‍ය අමාත්‍යාංශය සඳහා වෙන්කරන ලද කාර්ය මණ්ඩලය (රාකස-3, රියදුරු-01, කාසේස-01) ඇතුළත්කර නොමැත.

<u>සංවිධාන සටහන</u>

<u>සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය</u>

<u>වනජීවී අංශය</u>



## 1.3 අමාත්‍යාංශයේ අංශ

අමාත්‍යාංශය අංශ දෙකක් යටතේ ක්‍රියාත්මක වේ.

I. සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අංශය

II. වනජීවී අංශය

### 1.3.1 සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අංශය

මෙම අංශයට ප්‍රධාන අංශ හතරක් ඇත. පරිපාලන, සංවර්ධන හා සැලසුම්, මූල්‍ය හා අභ්‍යන්තර විගණන එම අංශ වේ.

#### 1.3.1.1 පරිපාලන අංශය

මෙම අංශය අතිරේක ලේකම් (පරිපාලන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු) විසින් මෙහෙයවනු ලබයි.
මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වන්නේ:

- කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, ස්ථානගත කිරීම, උසස්වීම් ලබාදීම සහ විශ්‍රාම ගැන්වීම
- අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීම
- කාර්ය මණ්ඩලයේ කාර්යසාධනය ඇගයීම සහ දිරිදීමනා ලබාදීම
- කාර්ය මණ්ඩලයට අදාළ දත්ත සමුදාය පවත්වාගෙන යාම
- විනය කළමණාකරණය
- රාජ්‍ය ආයතන සමඟ සන්නිවේදන කළමනාකරණය
- අතිරේක සේවාවන් සහ ප්‍රසම්පාදන කළමනාකරණය
- ඵලදායිතාව වැඩිදියුණු කිරීම
- අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතනවල පරිපාලනය සමාලෝචනය කිරීම
- සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු සම්බන්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම

**පරිපාලන අංශයේ කාර්ය සාධනය**

**පුහුණු වැඩසටහන්**

අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ හැකියාවන් ඉහළ නැංවීම සඳහා දේශීය හා විදේශීය වශයෙන් ප්‍රමාණවත් පුහුණු අවස්ථාවන් අමාත්‍යාංශය ලබා දෙයි.

2018 වර්ෂය තුළදී, අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ 29 දෙනෙක් සඳහා විදේශීය පුහුණුව ලබා දී ඇත.

සේවක ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා දැනුම හා ආකල්ප වැඩිදියුණු කිරීමේ අරමුණින් අමාත්‍යාංශය විසින් පුහුණු වැඩසටහන් තුනක් සංවිධානය කරන ලදී.

මෙම අංශය විසින් තිරසාර සංචාරක කර්මාන්තය පිළිබඳ අවබෝධය හා කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීම සම්බන්ධව විශේෂ අවධානය යොමු කරමින්, සංචාරක අංශයේ කාර්ය මණ්ඩලය සඳහා තෙදින පොදු බාහිරගත ධාරිතා සංවර්ධන වැඩසටහනක් සමනළවැව සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. පුහුණු වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසු, මෙයට සහභාගිවූ 60 දෙනෙක් සඳහා සහතිකපත් ප්‍රදානය කරන ලදී.




ඡායාරූපය: සමනලවැව දී සිදුකරන ලද බාහිරගත පුහුණුව අතරතුර කණ්ඩායම් ක්‍රියාකාරකම්



ඡායාරූපය: සමනලවැවදී සිදුකරන ලද බාහිරගත පුහුණුව සඳහා සහභාගිවූ කණ්ඩායම

මීට අමතරව, අමාත්‍යාංශය විසින් කාර්ය මණ්ඩලයේ 20 දෙනෙකු වෙනත් දේශීය පුහුණු ආයතනවල විවිධ විෂයයන් යටතේ පුහුණු කර ඇත.


**අමාත්‍ය මණ්ඩල සංදේශ**

සංචාරක සංවර්ධන ව්‍යාපෘති, ක්‍රිස්තියානි ආගමික කටයුතු සහ CITES CoP18 සමුළුව සම්බන්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 30 ක් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

**ක්‍රිස්තියානි ආගමික කටයුතු**

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී පහත දැක්වෙන පරිදි අමාත්‍යාංශය මගින් ආගමික පිරිස් විසින් ඉදිරිපත් කරන ලද සංචාරක වීසා අයදුම්පත් ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත නිර්දේශ කරන ලදි.

වගුව – 1.2




මූලාශ්‍රය: පාලන අංශය,සංචාරක සංවර්ධන,වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

### 1.3.1.2.මුදල් සහ ගිණුම් අංශය

අමාත්‍යාංශයේ මූල්‍ය සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් මෙම අංශය වගකීම් දරයි. විශාල පරාසයක් තුළ මූල්‍ය මෙහෙයුම්, වත්කම් කළමනාකරණය, මූල්‍ය වාර්තාකිරීම් සහ වෘත්තීය සේවා ඇතුලු සහාය සේවා මුදල් අංශය මගින් සපයනු ලැබේ. මෙම අංශයේ ප්‍රධාන කාර්යයන්:

- වාර්ෂික අයවැය ඇස්තමේන්තු කෙටුම්පත සකස් කිරීම.
- විසර්ජන ගිණුම් සහ වෙනත් අවසාන ගිණුම් සකස් කිරීම.
- අය වැයෙන් වෙන්කිරීම් සම්බන්ධයෙන් අඛණ්ඩ අධීක්ෂණය.
- මූල්‍ය වාර්තා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම.
- සියලුම මූල්‍ය කටයුතු පිළිබඳ කටයුතු කිරීම.
- වත්කම් කළමනාකරණය.

### 1.3.1.3. අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය

අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය 2016 නොවැම්බර් මස අභිනවයෙන් ස්ථාපිත කරන ලද අතර එය මු.රෙ 134 (1) පරිදි අමාත්‍යාංශයේ ලේකම් වෙත වගකියනු ලබන ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ.

### 1.3.1.4. සංවර්ධන අංශය

මෙම අංශය අතිරේක ලේකම් (සංවර්ධන ) යටතේ ක්‍රියාත්මක වේ. මෙමඟින් අදාල ආංශික ආයතන හා පාර්ශවකරුවන් සම්බන්ධීකරණය කරමින් සංවර්ධන අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දරනු ලැබේ.දේශීය හා විදේශීය සංචාරකයන් සඳහා විධිමත් සේවා සපයන බව තහවුරු කිරීම තුළින් සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම අංශය මඟින් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලැබේ.සංචාරක ගමනාන්ත සංවර්ධනය, සංචාරක අංශයේ ඍජු හා වක්‍ර රැකියා අවස්ථා නිර්මාණය, දිවයිනෙහි තිරසර සංචාරක සංවර්ධනය සිදු වන බව තහවුරු කිරීම, විදේශීය සහය මඟින් නව තාක්ෂණයන් හඳුන්වාදීම මෙම අංශය මඟින් අරමුණු කර ඇති ක්ෂේත්‍ර අතරට අයත්වේ. මෙම අංශය යටතේ කාර්යයන් උප ඒකක දෙකක් යටතේ ක්‍රියාත්මකවේ.

**සංවර්ධන ඒකකය**

මෙම ඒකකය අධ්‍යක්ෂ (සංවර්ධන) යටතේ ක්‍රියාත්මක වේ. මෙමඟින් අදාල ආංශික ආයතන හා පාර්ශවකරුවන් සම්බන්ධීකරණය කරමින් සංවර්ධන අංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දරනු ලැබේ. මෙම ඒකකය මඟින් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, සංචාරක ගමනාන්ත සංවර්ධනය,සංචාරක ක්ෂේත්‍රයේ ඍජු හා වක්‍ර රැකියා අවස්ථා නිර්මාණය, දිවයිනෙහි තිරසර සංචාරක සංවර්ධනය සිදුවන බව තහවුරු කිරීම සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලැබේ.

මෙම ඒකකය මගින් සිදුකරන කාර්යයන් පහත පරිදි වේ.

- අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු ලඟා කර ගැනීම සඳහා අමාත්‍යාංශයේ සියලුම සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් කටයුතු කිරීම
- සියලුම සංචාරක සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ගැටලු විසඳීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම
- සංචාරක සංවර්ධනයේදී ජාත්‍යන්තර සහයෝගිතාව
- සංචාරක සංවර්ධන කාර්යයන්වල නව ප්‍රවණතා
- ඊ-රාජ්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම

**සැලසුම් සහ අධීක්ෂණ ඒකකය**

මෙම ඒකකය අධ්‍යක්ෂ (සැලසුම්) යටතේ ක්‍රියාත්මක වේ. අමාත්‍යාංශයේ සැලසුම් සහ අධීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් මෙම ඒකකය වගකියනු ලබයි. සංචාරක ක්ෂේත්‍රය සඳහා පිළියෙල කරන ලද ජාතික සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සකස් කිරීම සම්බන්ධීකරණය කිරීමට සහ පහසුකම් සැපයීමට සැලසුම් අංශය බැඳී සිටී. මෙම කාර්යය සාර්ථක කරගැනීමට මෙම ඒකකය ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණයෙන් රජයේ රාජ්‍ය ආයෝජන වැඩසටහන් සහ ව්‍යාපෘති සඳහා පහසුකම් සැපයීමට සහ සම්බන්ධිකරණය සඳහා ප්‍රධාන මෙහෙයක් ඉටු කරයි.

ඒ අනුව මෙම ඒකකයේ කාර්යයන් පහත පරිදි වේ.

- සෑම වර්ෂයකටම අදාළව භාණ්ඩාගාරයෙන් ලැබීම්වලට අනුකූලව අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම සහ එම ඉලක්ක අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු සහ ආයතනවල අදාළ විෂය පථය යටතට බෙදාහරිනු ලැබේ.
- ක්‍රියාකාරී සැලැස්ම අනුව මාසික/කාර්තුමය ප්‍රගති වාර්තා සහ එම සංවර්ධන කාර්යයන්ගේ ප්‍රගතිය කාර්තුමය වශයෙන් සමාලෝචනය ලබාගැනීම. ඊට අමතරව, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ කාර්තුමය මූල්‍ය සහ භෞතික ඉලක්ක අනුව කටයුතු කරමින් ආයතනික මට්ටමෙන් ප්‍රගති සමාලෝචනය කරනු ලබයි.
- අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රගති වාර්තාව අනුව ප්‍රතිඵල ඉලක්ක කරගත් අගැයීම් ක්‍රියාවලියක් පිළිබඳ කටයුතු කිරීම.
- අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය සහ කාර්යසාධන වාර්තාව පිළියෙල කිරීම සහ ඒවා අදාළ බලධාරීන් වෙත ඉදිරිපත් කිරීම
- දෙපාර්තමේන්තු සහ ආයතන මගින් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන අලුත් ව්‍යාපෘති යෝජනා අගැයීමට ලක්කිරීම සහ ඒවා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව සහ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

## 1.3.2.වනජීවී අංශය

පැවති තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය අංක 2070/56 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2018 මැයි මස 12 වන දින තිරසර සංවර්ධන, වනජීවී හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවන ලද අතර 2096/17 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් 2018 නොවැම්බර් මස 05 වන දින සංචාරක හා වනජීවී අමාත්‍යාංශය ලෙස පිහිටුවන ලදී. නැවත අංක 2103/33 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 2018 දෙසැම්බර් මස 28 වන දින සංචාරක සංවර්ධන, වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය නමින් පිහිටුවන ලදී.

**අමාත්‍යාංශයේ වනජීවී අංශය යටතේ ක්‍රියාත්මක දෙපාර්තමේන්තු, ආයතන**

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා වනජීවී භාරය

වනජීවී අංශය විසින් වනජීවී සංරක්ෂණ , ජාතික උද්භිද උද්‍යාන, ජාතික සත්වෝද්‍යාන යන දෙපාර්තමේන්තු ත්‍රිත්වයේ හා වනජීවී භාරයට අදාළව ප්‍රතිපත්ති සැකසීම,සංවර්ධන කටයුතු වලට අදාල මග පෙන්වීම ලබාදෙමින් එම සංවර්ධන වැඩසටහන්හි ප්‍රගතිය පරීක්ෂා කිරීම හා ඇගයීම් සිදු කරමින් පරිපාලනමය කටයුතු සම්බන්ධීකරණ හා අධීක්ෂණය කිරීමත් සිදුකෙරේ. එසේම වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත, උද්භිත උද්‍යාන ආඥා පනත හා ජාතික සත්ත්ව උද්‍යාන පනත ක්‍රියාත්මක කරවීම තවදුරටත් සිදුකරනු ලැබේ.

**කාර්ය මණ්ඩල තොරතුරු - 2018.12.31 දිනට**

| අ.අ. | සේවක වර්ගීකරණය | අනුමත | සේවයේ නියුතු |
|---|---|---|---|
| **1** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 20 | 16 |
| **2** | තෘතිය මට්ටම | 03 | 02 |
| **3** | ද්විතීය මට්ටම | 53 | 44 |
| **4** | ප්‍රාථමික මට්ටම | 32 | 19 |
| | එකතුව | **108** | **81** |

මූලාශ්‍රය : වනජීවී අංශය-පාලන අංශය

### 1.3.2.1. වනජීවී අංශය යටතේ ඇති අංශ

### 1.3.2.1.1.පාලන අංශය

**කාර්යභාරය**

- අමාත්‍යාංශය තුළ සාමාන්‍ය පරිපාලනය හා විනය පවත්වාගෙන යාම
- අමාත්‍යාංශයේ සියලු නිලධාරීන්ගේ ආයතන කටයුතු සිදු කිරීම
- දෙපාර්තමේන්තුවේ ආයතන කටයුතු නිසියාකාරව සිදු කිරීමට අමාත්‍යාංශයෙන් අවශ්‍ය සහය ලබා දීම
- පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව, පාර්ලිමේන්තු ප්‍රශ්න හා අමාත්‍ය මණ්ඩල සංදේශ වලට අදාල කටයුතු සිදු කිරීම
- අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම

**2018.12.31 දිනට ප්‍රගතිය**

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාල මූලික විමර්ශන 10 ක් 2018 වර්ෂය තුළදී අවසන් කර ඇත. එසේම විධිමත් විනය පරීක්ෂණ 06 ක් සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත සහ රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත අදාල වාර්තා නිසි පරිදි යොමු කර ඇත.
- මෙම අමාත්‍යාංශයේ සේවයේ නියුතු සියලුම නිලධාරීන්ගේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 පරිදි වන වැටුප් පරිවර්තන සිදු කළ අතර සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් 60 ක් සඳහා වැටුප් වර්ධක ගෙවනු ලැබ ඇත.
- වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ 01/2018 අනුව වාහන බලපත්‍ර 05 ක් නිකුත් කර ඇති අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 යටතේ 2018 වර්ෂයේ දී විශ්‍රාම ලැබූ නිලධාරීන් දෙදෙනෙකු (02) සඳහා වාහන බලපත්‍ර නිකුත් කර ඇත.
- 2018 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල සංදේශ 10 ක් යොමු කළ අතර අමාත්‍ය මණ්ඩල සංදේශ 06 ක් සඳහා එම වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල තීරණ ලැබී ඇත.
- 2018 වර්ෂයේ සේවයේ නියුතුව සිටි නිලධාරීන් 85 දෙනෙකු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XII වැනි පරිච්ඡේදයේ විධිවිධාන ප්‍රකාරව නිවාඩු ඉල්ලුම් සම්බන්ධයෙන් වන කාර්යයන් නිසි පරිදි ඉටුකර ඇත.
- ස්ථාන මාරුවීම් ලැබූ නිලධාරීන් 27 සම්බන්ධයෙන් වන නිවාඩු වාර්තා එකී දෙපාර්තමේන්තු වෙත යැවීමට කටයුතු කර ඇත.
- අමාත්‍යාංශ නිලධාරීන් අතරින් දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ඉල්ලා සිටි නිලධාරීන් 6ක් සඳහා තෛමාසික දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර නිකුත් කර ඇත.
- නිවාඩු දුම්රිය බලපත්‍ර 68 ක් අමාත්‍යාංශ නිලධාරීන් වෙත නිකුත් කර ඇත.
- සියලුම මාණ්ඩලික නිලධාරීන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ නිසි පරිදි ලබාගෙන ඇත.
- අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලයේ ,ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලයේ සහ අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා දුරකථන පහසුකම් ලබා දී ඇති අතර බිල්පත් ගෙවන ලද දුරකථන සංඛ්‍යාව 54 කි.
- මහජන පැමිණිලි සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයට වෙත ජනාධිපති කාර්යාලයෙන් ලිපි 09 ක් අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ලිපි 06 ක් ලැබුණු අතර ඒ සියලුම ලිපි සඳහා නිසි ක්‍රියාමාර්ග ගෙන ඇත.
- තවද, ජනපතිට කියන්න වැඩසටහන යටතේ යොමු කරන ලද මහජන පැමිණිලි සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.
- අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය හා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලයේ පත්වීම් සිදු කිරීම සම්බන්ධයෙන් නිසි පරිදි කටයුතු සිදු කර ඇති අතර අමාත්‍යාංශයේ පුරප්පාඩුව පැවති කාර්යාල කාර්ය සහායක තනතුරු 08 හා රියදුරු තනතුරු සඳහා බඳවාගැනීම්සිදු කර ඇත.
- තොරතුරු දැන ගැනිමේ පනතට අදාලව 2018 වර්ෂයේ ඉල්ලීම් 19 ක් ලැබී ඇති අතර මෙම අමාත්‍යාංශයට අදාල වූ ඉල්ලීම් 6 ක් සඳහා පිළිතුරු ලබා දී ඇති අතර 02 ක් ප්‍රතික්ෂේප කර ඇත.
- අමාත්‍යාංශයට අදාල නොවූ සෙසු ඉල්ලීම් අදාල දෙපාර්තමේන්තු වෙත යොමු කර ඇත.
- අමාත්‍යාංශයට අදාල ගොඩනැඟිලි කුලී, පවිත්‍රතා සේවා සම්බන්ධයෙන් වන සේවා ගාස්තු ගෙවීම් නියමිත පරිදි සිදු කර ඇත.
- අර්ථ සාධක අරමුදලට අදාල අයදුම්පත්‍ර 17 ක් අදාල නිර්දේශ සහිතව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී.
- පාර්ලිමේන්තු වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න 08 ක් සඳහා ද, ස්ථාවර නියෝග 27 (2) යටතේ අසනු ලබන ප්‍රශ්න 01 ටද, සභාව කල් තබන අවස්ථාවේ දී අසනු ලබන ප්‍රශ්න 01 ට සහ පාර්ලිමේන්තු අයවැය විවාදය සඳහා අසනු ලබන ප්‍රශ්න 01 ක් සඳහා ද නියමිත දිනට පෙර පිළිතුරු ලබා දී ඇත.
- තිරසර සංවර්ධන හා පාරසරික හා ස්වභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත තොරතුරු ලබා ගැනීම සඳහා කරුණු 12 ක් ඉදිරිපත් කර ඇති අතර එම සියලු කරුණු සඳහා සම්පිණ්ඩන වාර්තා නියමිත වේලාවට අදාල පාර්ශව වෙත ඉදිරිපත් කර ඇත.
- මහජන පෙත්සම් කාරක සභාව මඟින් විමසන ලද මහජන ගැටලු 03 ක් සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා පිළිතුරු සපයා ඇත.
- අභ්‍යන්තර විගණන විමසුම් 02 ක් සඳහා පිළිතුරු සපයා ඇත.
- හෝමාගම සම්පත් කලාපීය මධ්‍යස්ථානය, වරකාපොල, කාර්මික විද්‍යාලය, මහරගම, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය යන ආයතන මඟින් යොමු කළ පැමිණි අභ්‍යාසලාභි පරිගණක පුහුණුවන්නන් 13 ක්

සඳහා ප්‍රායෝගික පුහුණු අවස්ථා ලබා දී ඇත.

- වනජීවී අංශය සතු වාහන 35ක් පැවති අතර එම වාහන ගරු අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය සහ නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලයටත් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වෙන්කර දීමෙන් අනතුරුව සෙසු වාහන වනජීවී අංශයේ කටයුතු සඳහා යොදා ගන්නා ලදී.
- ඉහත වාහන අතරින් බුද්ධ ශාසන අමාත්‍යාංශය වෙත වාහන 03ක් පවරා දීමට කටයුතු කර ඇති අතර සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත 03ක්ද, උද්භිද උද්‍යානය වෙත 1ක්ද, වනජීවී දෙපාර්තමේන්තුව වෙත1ක්ද, අනුයුක්ත කර ඇත.
- වාහන 5කට අදාළ මුදල් රෙගුලාසි 103 ප්‍රකාරවන පරීක්ෂණ සිදුකර ඇත.
- ඉහත වාහන සඳහා වන වාහන පිරිවැය වාර්තා කාර්තුමය වශයෙන් නිසි පරිදි විගණනයට ඉදිරිපත් කර ඇති අතර දෛනික ධාවන සටහන්ද නිසි පරිදි විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.

**පුහුණු වැඩසටහන්** වගුව 1.3

| පුහුණු වර්ගය | පාඨමාලා ගණන | සහභාගීවූ නිලධාරීන් ගණන |
|---|---|---|
| බාහිර ආයතන මගින් ලබාදුන් පුහුණු වැඩසටහන් - දේශීය | 22 | 35 |
| බැහැරගත පුහුණු වැඩසටහන | 01 | 50 |
| විදේශීය පුහුණු වැඩසටහන් | 14 | 14 |

මූලාශ්‍රය : වනජීවී අංශය-පාලන අංශය

### 1.3.2.1.2.සැලසුම් අංශය

දෙපාර්තමේන්තුවල සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීම,සැකසීම හා ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහාය ලබාදීම ප්‍රධාන වශයෙන් මෙම අංශයෙන් සිදුකරනු ලැබේ. ඒ අනුව ජාතික අවශ්‍යතාවන් හඳුනා ගනිමින් සංවර්ධන කටයුතු සැලසුම් කෙරෙන අතර ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම ,වනජීවී අංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු වල ප්‍රගතිය ලබා ගැනීම හා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම, ප්‍රගති වාර්තා සැකසීම, අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කිරීම සඳහා කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික කාර්යසාධන වාර්තාව සැකසීම,ජනාධිපති කාර්යාලයට, මුදල් අමාත්‍යාංශයට, ප්‍රතිපත්ති සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට, ශ්‍රී ලංකා මහ බැංකුව හා අනෙකුත් රේඛීය අමාත්‍යාංශ වල අවශ්‍යතාවය මත තොරතුරු ලබාදීම මෙම අංශය මගින් සිදුවේ. තව ද මෙම අංශය මඟින් අමාත්‍යාංශයට අයත් ආයතනවල ප්‍රතිඵල, කාර්යක්ෂමතාව සහ සඵලතාව පිළිබඳ තොරතුරු ලබා ගැනීම, විශ්ලේෂණය කිරීම, මෙහෙයවීම හා ඇගයීම සිදු කරනු ලැබේ.

### 2018.12.31 දිනට කාර්යසාධනය

- 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස්කර අදාල ආයතන සඳහා යොමුකර ඇත.
- වනජීවී අංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු හා ආයතනයන්හි කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් 13ක් පවත්වන ලදී.
- 2018 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකසා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට හා අදාළ අනෙකුත් ආයතන වෙත ලබා දී ඇත.
- ජනාධිපති ලේකම් කාර්යාලයට, මුදල් අමාත්‍යාංශයට, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවට, ශ්‍රී ලංකා මහ බැංකුවට, අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට අවශ්‍ය තොරතුරු ලබා දී ඇත.
- වනජීවී, උද්භිද උද්‍යාන සහ සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවල ප්‍රගතිය සම්බන්ධ ගැටළු වලදී අදාල ආයතන සමඟ එක්ව ඒවා නිරාකරණය සඳහා කටයුතු කර ඇත.
- දෙපාර්තමේන්තු යටතේ ඇති ජාතික උද්භිද උද්‍යාන හා සත්වෝද්‍යාන වලට පැමිණෙන සංචාරකයින් සම්බන්ධ තොරතුරු යාවත්කාලීන කිරීමේ කටයුතු සිදුකර ඇත.
- වනජීවී සංරක්ෂණ, උද්භිද උද්‍යාන, සත්වෝද්‍යාන දෙපාර්තමේන්තු වල ව්‍යාපෘති ක්ෂේත්‍ර නිරීක්ෂණ 12

ක් සිදුකරන ලදී.

### 1.3.2.1.3. ගිණුම් අංශය

වනජීවී අංශය යටතේ ඇති ආයතනවල මූල්‍ය පාලන කාර්යභාරයට අවශ්‍ය ඍජු සහාය දැක්වීම මෙම අංශයේ ප්‍රධාන කාර්යය හා කර්තව්‍යයයි. ඒ අනුව වනජීවී අංශය යටතේ ඇති ආයතනවල මූල්‍ය පාලන කටයුතු සැලසුම් කිරීම, සංවිධානය කිරීම, මෙහෙයවීම හා ඊට අදාල පාලන කටයුතු ගිණුම් අංශය මඟින් ඉටුකරනු ලබයි.

**2018.12.31 දිනට ප්‍රගතිය**

- වාර්ෂික විසර්ජන පනතින් බලය ලැබූ වියදම්, මුදල් රෙගුලාසි, අණපනත්, චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කරමින් කළමනාකරණය කිරීම.
- විගණකාධිපතිට හා මහා භාණ්ඩාගාරයට අවශ්‍ය මාසික, ත්‍රෛමාසික, අර්ධ වාර්ෂික හා වාර්ෂික වාර්තා ඉදිරිපත් කර ඇත.
- විසර්ජන ගිණුම ඇතුළු අවසාන ගිණුම් සකසා ඉදිරිපත් කර ඇත.
- ගබඩා හා වත්කම් කළමනාකරණය සිදුකර මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.
- වාර්ෂික වියදම් හා ආදායම් ඇස්තමේන්තු සැකසීම සිදුකර ඇත.
- වනජීවී අංශයට අදාල වැටුප්, පොදු තැන්පත් ඇතුළු සියළුම මූලධන හා පුනරාවර්තන ගෙවීම් කටයුතු සිදුකර ඇත.
- වනජීවී අංශය හා ඒ යටතේ පවත්නා දෙපාර්තමේන්තු හා ආයතනවල ප්‍රසම්පාදන කමිටු පත්කිරීම හා ප්‍රසම්පාදන කාර්යයන් සිදුකර ඇත.
- වනජීවී අංශයේ හානි හා පාඩු පිළිබඳ ගිණුම් කටයුතු හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල හානි හා පාඩු වාර්තා සැකසීම, වාර්තා කිරීම, සැසඳීම හා විගණකාධිපතිට ඉදිරිපත් කර ඇත.
- රාජ්‍ය ගිණුම් කාරකසභා හා රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරකසභා කටයුතු ඉටු කිරීම හා වනජීවී අංශය යටතේ ඇති ආයතනවල ගිණුම් කාරකසභා කටයුතු සම්බන්ධීකරණය කිරීම සිදුකර ඇත.
- වනජීවී අංශයේ මාසික හා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම, අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනවල වාර්ෂික ගිණුම් හා වාර්තා අධීක්ෂණය.
- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමෙන් ණය ගෙවීම, ඒවා නිසි පරිදි අය කරගැනීම හා ඊට අදාල ගිණුම් පවත්වා ගැනීම.
- විගණකාධිපතිගේ විගණන විමසුම් සම්බන්ධ කටයුතු සිදුකර ඇත.
- වාර්ෂික මුදල් ප්‍රවාහ කටයුතු, ප්‍රධාන අග්‍රිම, අතුරු අග්‍රිම අධීක්ෂණය හා පාලනය, ගිණුම් තැබීම හා වාර්තා කිරීම.
- වනජීවී අංශය යටතේ ඇති ආයතනවල අරමුදල් පාලන කටයුතු හා ගිණුම් කටයුතු පිළිබඳ අධීක්ෂණමය කාර්යයන් ඉටු කිරීම සහ ඒවායේ අයවැය හා වාර්ෂික ගිණුම් පිළිබඳ කටයුතු සිදුකර ඇත.

### 1.3.2.1.4. සංවර්ධන අංශය

වනජීවී සංරක්ෂණ , ජාතික උද්භිද උද්‍යාන සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තු මගින් සිදු කරනු ලබන සංවර්ධන කටයුතු විධිමත්ව හා ඵලදායීව ක්‍රියාවට නැංවීම අධීක්ෂණය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සිදු කිරීම මෙම අංශය මගින් සිදුකරනු ලබයි.

**2018.12.31 දිනට ප්‍රගතිය**

- ජාතික උද්‍යාන තුල වැව් ප්‍රතිසංස්කරණය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාත්මක කරවීම මගින් වනජීවී දෙපාර්තමේන්තුවේ උද්‍යාන වල වැව් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අනුමැතිය ලබා දී ඇත.
- සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය අවස්ථා වල වනජීවී අංශයේ සහය ලබාදී ඇත.
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් පින්නවල නව සත්වෝද්‍යානයට සහ අලි අනාථාගාරය පුළුල් කිරීම සම්බන්ධයෙන් අත්පත් කර ගන්නා ඉඩම් නිශ්චිතව හදුනා ගැනීම හා අත්පත් කර ගැනීමට නොහැකි ඉඩම් නිශ්චය කර ගැනීම.
- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් පින්නවල නව සත්වෝද්‍යානයට සහ අලි අනාථාගාරය පුළුල්

කිරිම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේදී නව අත්පත් යෝජනා 03ක් ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත.

- වනජීවී සංරක්ෂණ, වනෝද්‍යාන සහ උද්භිද උද්‍යාන සම්බන්ධ පොදු කටයුතු සිදු කිරීම
- අලි මිනිස් ගැටුම නිමා කිරීම දායක වීම යන මැයෙන් යෝජනා කැඳවීමට අදාළව ලැබුණු යෝජනා 40ක් පමණ සාරාංශ ගත කර ඉදිරිපත් කිරීම
- වනජීවී ඉඩම් ගැටලු විසඳීම සඳහා සම්බන්ධව කමිටුවක් පිහිටුවා ඇති අතර එමගින් ගැටළු නිරාකරණය කිරීම ඇරඹීම
- ගුවන් ආවේශන 20ක් පිළිබඳ ගුවන් හමුදාව විසින් තොරතුරු ඉදිරිපත් කර ඇත. ඉන් 14කට අදාළ ස්ථාන පරීක්ෂා කර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රතිචාර දක්වා ඇත.
- මුලතිව් දිස්ත්‍රික්කයේ විශ්ව මඩු ප්‍රදේශයේ ජන ජීවිතයට වන අලින්ගෙන් සිදුවන හානි වැළැක්වීම සඳහා පාරිසරික සංරක්ෂණ වැඩසටහන් යටතේ විදුලිවැට ඉදිකිරීම සඳහා රු.මි 5ක ප්‍රතිපාදන වනජීවී දෙපාර්තමේන්තුවට ලබා දෙන අතර දැනට විදුලි වැට ඉදිකිරීම සඳහා රු.4,748,787.60 වියදම් සපයාගෙන ඇත. අනෙකුත් ආයතන, ප්‍රාදේශීය ලේකම්වරුන් හා දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් ලැබී ඇති විදුලි වැට ඉදිකිරීම හා ඉදිකරන ලද විදුලිවැට සම්බන්ධ ගැටළු 20ක් පමණ වනජීවී දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

### 1.3.2.1.5. අභ්‍යන්තර විගණන අංශය

මුදල් රෙගුලාසි 133 හි දැක්වෙන අභ්‍යන්තර විගණන පරමාර්ථ ඉටුවන පරිදි ස්ථාපිත කර ඇති අභ්‍යන්තර විගණන අංශය අමාත්‍යාංශයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු පිළිබඳව ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන ක්‍රම වල කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඇගයීම සඳහා නිරන්තර සෝදිසි පරීක්ෂණ සිදු කරනු ලැබේ. වාර්ෂික විගණන සැලැස්ම පරිදි වනජීවී අංශයේ අභ්‍යන්තර විගණන කටයුතු හා විශේෂ විමර්ශන කටයුතු ඉටුකරන අතරම වනජීවී අංශය යටතට ගැනෙන වනජීවී සංරක්ෂණ,ජාතික උද්භිද උද්‍යාන සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වනජීවී අංශය වෙනුවෙන් විශේෂ පරීක්ෂණ කටයුතු මෙහෙය වීමද සිදුකරනු ලැබේ.

### 1.3.2.1.6. තාක්ෂණ අංශය

මෙම අංශය මඟින් වනජීවී අංශය යටතේ පවතින ආයතන සම්බන්ධව ඇති විද්‍යාත්මක සහ තාක්ෂණික කටයුතු සඳහා සහායවීම සහ එම කටයුතු විධිමත්ව හා ඵලදායීව ක්‍රියාවට නැංවීම සඳහා මනාව සම්බන්ධීකරණය මෙන්ම අධීක්ෂණය සිදුකරනු ලබයි.

### 2018.12.31 දිනට ප්‍රගතිය

- විල්පත්තුව ජාතික උද්‍යානය සහ එහි ප්‍රේරක කලාපය තුළ ජර්මානු රජයේ ආධාර මත ක්‍රියාත්මක වන " විල්පත්තු වනෝද්‍යානයේ ප්‍රේරක කළාප කළමනාකරණ " (GIZ ) ව්‍යාපෘතියේ කටයුතු 2019.01.31 දින දක්වා දීර්ඝ කිරීම
- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කර ඇති හග්ගල උද්භිද උද්‍යානයේ සංවර්ධන කටයුතු සහ ශාකාගාරය සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කිරීමේ ව්‍යාපෘති යෝජනා 02ක් සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.
- උප කඳුකර ශාක විතැන් සංරක්ෂණය සඳහා නව දත්ත සංචිතයක් (Data Base) තබා ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂනික දැනුම ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයෙන් (ICTA) ලබා ගැනීමටත් ඒ සඳහා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනින් (UNDP) ලබා ගැනීම සඳහාත් අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- වනජීවී වාසස්ථාන සුපෝෂණ ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විශේෂ රැස්වීමක් කැඳවා අවශ්‍ය උපදෙස් ලබාදීම.
- ජෛව පද්ධති සංරක්ෂණය සහ කළමනාකරණ ව්‍යාපෘතිය (ESCAMP) මගින් ඉදිරිපත් කරන ලද උප ව්‍යාපෘති (ගිරිතලේ පශු වෛද්‍ය රෝහලේ නව ඉදිකිරීම්, ගිරිතලේ වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රයේ ප්‍රතිසංස්කරණ කටයුතු) සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම
- සංශෝධිත වන අලි සංරක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳව මහජනතාවගේ අදහස් ලබා ගැනීම සඳහා ත්‍රෛ භාෂාවෙන්ම ජාතික පුවත්පත්වල පල කිරීමට අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු

සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

- Sri Lanka—South Africa Partnership Forum යටතේ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත සතුන් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම
- වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ සඳහන් ආරක්ෂිත ශාක සම්බන්ධව රෙගුලාසි කෙටුම්පතක් සකස් කිරීම සඳහා කමිටුවක් පත්කර ඒ සඳහා කමිටු රැස්වීම් පවත්වා අදාල කෙටුම්පත සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.
- වන සතුන්ගෙන් සිදුවන වගා හානි වැළැක්වීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් පත් කර ඇති කමිටුවට සහභාගීවීම

### 1.3.2.1.7 තිරසර සංවර්ධන අංශය

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය හෙවත් තිරසර සංවර්ධන අභිමතාර්ථයන් ( SDG'S) ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සහ පහසුකම් සැලසීම සිදුකරන කේන්ද්‍රීය ජාතික මට්ටමේ ආයතනය වන්නේ වනජීවී අංශයේ තිරසර සංවර්ධන අංශයයි.

තිරසර සංවර්ධන අංශයේ මූලික මෙහෙවර වූයේ සමෝධායික ප්‍රවේශයක්, අන්තර් අමාත්‍යාංශ/ ආයතන යාන්ත්‍රණයක් සහ පාර්ශවකරුවන්ගේ පුළුල් සහභාගීත්වය තුලින් පාරිසරික, සමාජීය සහ ආර්ථික තිරසරභාවය සහතික කරලීම උදෙසා සංවර්ධන අභියෝගයන් මෙහෙයවීම පිණිස වන ප්‍රතිපත්ති, උපායමාර්ග, යාන්ත්‍රණයක් සහ ක්‍රම ශිල්පයන් පිළිබඳ සම්බන්ධීකරණය සිදු කිරීමයි.

තිරසර සංවර්ධන අංශය මගින් ශ්‍රී ලංකාව තිරසර සංවර්ධන අභිමතාර්ථයන් ඉටු කරලීම පිණිස වන ප්‍රතිපත්තිමය සහ ආයතනික රාමුවක් සහ ක්‍රමෝපායික හා කාර්යය සැලැස්මක් සැකසීමේ කාර්යය ආරම්භ කරන ලදී.

### 2018.12.31 දිනට ප්‍රගතිය

| | |
|---|---|
| **වෙන් කල ප්‍රතිපාදන** | - රු.මි. 40.00 |
| සංශෝධිත ප්‍රතිපාදන | - රු.මි. 22.00 |
| **වියදම** | - රු.මි. 17.62 |

1. අමාත්‍යාංශ උපාය මාර්ග සකස් කිරීම
   - ජාතික උපාය මාර්ග සකස් කිරීම
2. තිරසර සංවර්ධන සැලසුම් සකස් කිරීම
   - තිරසර සංවර්ධන අභිමතාර්ථ වලට අදාල දර්ශක පොත් සකස් කිරීම
   - තිරසර සංවර්ධන අභිමතාර්ථ අමාත්‍යාංශ සැලසුම්වලට ප්‍රවාහගත කිරීමට අදාල වැඩමුළු සිදු කිරීම
3. පළාත් මට්ටමින් තිරසර සංවර්ධන අභිමතාර්ථ ක්‍රියාත්මක කිරීම
4. තිරසර සංවර්ධන පර්යේෂණ සඳහා අනුග්‍රහය දැක්වීම
5. ස්වේච්ඡා ජාතික සමාලෝචනය
6. තිරසර සංවර්ධන අභිමතාර්ථ සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳව අනෙකුත් රටවල් සමඟ අත්දැකීම් හුවමාරු කර ගැනීම
7. ජාතික තිරසර සංවර්ධන තොරතුරු ද්වාරය නිර්මාණය කිරීම

### 1.3.2.1.8. නීති අංශය

- වනජීවී අංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු සමබන්ධව ඉටු කල යුතු නීති කටයුතු ඉටු කිරීම.
- පනත් සඳහා අවශ්‍යවන්නාවූ සංශෝධන හා රෙගුලාසි සකස් කිරීම සඳහා සහය ලබාදීම සහ එම සංශෝධන හා රෙගුලාසි නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
- වනජීවී අංශා හා දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් පවත්නා නඩු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයතු කිරීම
- නීතිපති දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන උපදේශාත්මක සාකච්ඡා සඳහා සහභාගීවීම සහ අවශ්‍ය නිරීක්ෂණ සකස්කර ඉදිරිපත් කිරීම

# පරිච්ඡේදය 2

# සංවර්ධන ක්‍රියාකාරකම්

# 2. සංචාරක සංවර්ධන

## 2.1 2020 වර්ෂය සඳහා උසස් මට්ටමේ අරමුණු

- 2020 වර්ෂයේදී උපයා ගැනීමට අපේක්ෂිත ඇ.ඩො. බිලියන 7 ක ඉලක්කය සමගින් ශ්‍රී ලංකාවේ දෙවන ශුද්ධ විදේශ විනිමය උත්පාදනය කරනු ලබන ක්ෂේත්‍රය සංචාරක කර්මාන්තය බවට පත්කිරීම.
- සංචාරක කර්මාන්තය සහ එහි සහායක කර්මාන්ත විසින් ශ්‍රී ලාංකිකයන් 600,000 ක් සේවයේ යොදවා ගැනීම.
- එක් සංචාරකයෙකු විසින් දෛනිකව වියදම් කරනු ලබන මුදල ඇ.ඩො. 210 දක්වා ඉහළ නැංවීම.

## 2.2 සංචාරක කාර්යසාධනය- 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා

වගුව 2.1

| සංචාරක පැමිණීම් (ගණන) | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 |
|---|---|---|---|---|---|---|
| විනෝදාශ්වාදය සඳහා | 1,274,593 | 1527153 | 1,798,380 | 2,050,832 | 2,116,407 | 2,333,796 |
| ව්‍යාපාරික කටයුතු සඳහා | 980,162 | 1,037,644 | 1,198,240 | 1,710,027 | 1,744,149 | N/A |
| වෙනත් | 94,320 | 29,381 | 23,323 | 37,121 | 70,683 | N/A |
| සංචාරකයන් රැඳී සිටින රාත්‍රීන් ප්‍රමාණය ('000) | 200,111 | 460,128 | 576,817 | 303,684 | 301,575 | N/A |
| කාමර වෙන් කිරීම් ප්‍රමාණය (%) | 10,961 | 15,119 | 18,163 | 20,918 | 23,068 | 25,205 |
| දළ සංචාරක ආදායම (රු. මිලි.) | 71.7 | 74.3 | 74.5 | 74.76 | 73.27 | N/A |
| මුළු රැකියා (ගණන) | 221,720 | 317,502 | 405,492 | 512,594 | 598,356 | 712,027 |
| ඍජු රැකියා | 270,150 | 299,890 | 319,436 | 335,659 | 359,215 | 388,487 |
| ඇස්තමේන්තුගත වක්‍ර රැකියා | 112,550 | 129,790 | 135,930 | 146,115 | 156,369 | 169,003 |
| සංචාරක පැමිණීම් (ගණන) | 157,600 | 170,100 | 183,506 | 189,544 | 202,846 | 219,484 |
| N/A දත්ත සකස්කර අවසන් නැත | | | | | | |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## 2.3. සංචාරකයින්ගේ පැමිණීමේ ප්‍රමුඛතම වෙළඳපොළ 10


වගුව 2.2

| රට | 2017 | 2018 | % |
|---|---|---|---|
| ඉන්දියාව | 384,628 | 424,887 | 10% |
| එක්සත් ජනපදය | 201,879 | 254,176 | 26% |
| චීනය | 268,952 | 265,965 | -1% |
| ජර්මනිය | 130,227 | 156,888 | 20% |
| ඕස්ට්‍රේලියාව | 81,281 | 110,928 | 36% |
| රුසියාව | 59,191 | 64,497 | 9% |
| ප්‍රංශය | 97,282 | 106,449 | 9% |
| ඇමරිකා එක්සත් ජනපදය | 57,479 | 75,308 | 31% |
| ස්වීඩනය | 24,275 | 28,267 | 16% |
| සවුදි අරාබිය | 35,481 | 34,703 | -2% |
| සමස්ත පැමිණීම | 2,116,407 | 2,333,796 | 10.3% |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## 2.4. විදේශ විනිමය උත්පාදකයක් ලෙස සංචාරක ව්‍යාපාරයේ වර්ධනය (ඇ.ඩො.මිලියන)

ප්‍රස්තාරය 2.1




මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

## 2.5 . අමාත්‍යාංශයේ සංචාරක සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති

ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ විශාලතම ශක්තිය රඳාපවතින්නේ එහි ඇති ස්වාභාවික සම්පත්වල සුවිශේෂී විවිධත්වය, පෞරාණික හා අද්‍යතන සංස්කෘතිය, සමෘද්ධිමත් ඉතිහාසය සහ මිත්‍රශීලී ජනතාව මතය.

ශ්‍රී ලංකාව ඒකාබද්ධ සංචාරක ගමනාන්ත සංරක්ෂණය කිරීම, සංවර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම මඟින් තිරසර සංචාරක ගමනාන්ත ඵලදායි ලෙස ගොඩනැඟිය හැකි සංචාරක සැලසුම්කරණ ආකෘතියක් සහ ප්‍රවේශයක් ස්ථාපිත කිරීම සම්බන්ධ ක්‍රියාවලියක නිරත වී සිටී. සම්පත් ඉහළම ප්‍රතිලාභ ලබාගත හැකි අංශ වෙත මෙන්ම සියලුම මට්ටම්වල රජයේ ආයතන සඳහා (ජාතික,පළාත්,ප්‍රාදේශීය හා නාගරික) යොමුකල හැකි හෙයින් සංචාරක සැලසුම්කරණය විශේෂයෙන් වැදගත්වේ.

2018 අයවැය අනුව, සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය සංචාරක සංවර්ධන වැඩසටහන් හතක් ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 845.00 ක මුදලක් වෙන් කර ඇත.

එවැනි ව්‍යාපෘතිවල විස්තර පහත දැක්වේ.

**සංවර්ධන ව්‍යාපෘති -2018** වගුව: 2.3

| අංකය | සංවර්ධන ව්‍යාපෘති | ප්‍රතිපාදන (රු.මි) | සංශෝධිත ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) |
|---|---|---|---|---|
| | **අයවැය ප්‍රතිපාදන** | | | |
| 01 | සංචාරක ආකර්ෂණය සංවර්ධනය කිරීම | 375.00 | 390.00* | 256.83 |
| 02 | සංචාරක මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම | 40.00 | 40.00 | 31.65 |
| 03 | ප්‍රජා සංචාරක සංවර්ධනය (සංචාරක ගම්මාන සංවර්ධනය) | 25.00 | 10.00 | 2.19 |
| 04 | ඉහළ සංචාරක ආකර්ෂණයක් සහිත ප්‍රදේශවල සංචාරක පොලීසි ව්‍යාප්ත කිරීම | 30.00 | 30.00 | 0.012 |
| | එකතුව | 470.00 | 470.00 | 293.18 |
| | **විශේෂ අයවැය යෝජනා** | | | |
| 05 | සංචාරක හිතකාමී "ටුක් ටුක්" වැඩසටහන | 50.00 | 50.00 | 1.11* |
| 06 | බළකොටු 06 ක් සංවර්ධනය කිරීම | 250.00 | 250.00 | 3.77 |
| 07 | දුම්රිය ස්ථාන නවීකරණය කිරීම සහ ඒවා පුරාවිද්‍යාත්මක ස්ථාන ලෙස ප්‍රකාශයට පත් කිරීම | 75.00 | 75.00 | 35.538 |
| | එකතුව | 375.00 | 375.00 | 40.418 |
| | **මුළු එකතුව** | **845.00** | **845.00** | **331.088** |

*මූලාශ්‍රය:* සංචාරක සංවර්ධන,වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය **අතැනි බිල්පත්*

## 2.5.1 සංචාරක ආකර්ෂණය සංවර්ධනය කිරීම

එකිනෙක හා සබැඳි, ප්‍රශංසාත්මක කලාපීය හා දේශීය ගමනාන්ත ගොඩනැංවීම කෙරෙහි නැඹුරුවෙමින්, මෙම අමාත්‍යාංශය සාර්ථක හා තිරසර සංචාරක කර්මාන්තයක් වෙනුවෙන් ගමනාන්තවල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග රාශියක් ගෙන ඇත.මෙම ගමනාන්ත කාලයත් සමඟම ඔවුන් සංචාරකයන්ට ලබාදෙන සුවිශේෂී සේවාවන් නිශ්චිතව දක්වා ඇත.සංචාරක ක්ෂේත්‍රයේ පවතින ඉල්ලුම් හා සැපයුම් ගතිකතාවන්ට ගැලපීම සඳහා සංචාරක ආකර්ෂණ ස්ථාන,පොදු පහසුකම්,ප්‍රවේශ මාර්ග,මානව සම්පත්, සංචාරක ප්‍රතිරූපය හා මිල ගණන් ද ඒ සඳහා ඒකාබද්ධ කර ඇත.

කරුණු මෙසේ හෙයින්, ශ්‍රී ලංකාවේ පළාත්වල සංචාරක ව්‍යාපාරය හා සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා 2018 අයවැය මඟින් රු.මි. 390.00 ක මුදලක් වෙන්කර ඇත.

**ව්‍යාපෘතියේ අරමුණු:**

- ග්‍රාමීය ප්‍රදේශවල සංචාරක කර්මාන්තය සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමුකරන සංචාරක කර්මාන්තයේ තිරසාර වර්ධනයක් තහවුරු කිරීම.
- ග්‍රාමීය ප්‍රජාවේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා ග්‍රාමීය සංචාරක සංවර්ධන උපාය මාර්ග ඒකාබද්ධ කිරීම.
- ඍජු හා වක්‍ර රැකියා අවස්ථා ඇති කිරීම සහ කුඩා ව්‍යවසායකයින් හා වාණිජ මෙහෙයුම් කරුවන් සඳහා ආදායම් මූලාශ්‍ර වැඩි කිරීම.
- සංචාරකයින් සංඛ්‍යාව වැඩි කිරීම සහ දේශීය ආර්ථිකය තුළ මුදල් වියදම් කිරීම සඳහා සංචාරකයින් සඳහා පහසුකම් සැලසීම.
- විවිධ සංස්කෘතීන් හා ඒවායේ උරුමය පිළිබඳ අවබෝධය ප්‍රවර්ධනය කිරීම.

**සංචාරක ආකර්ෂණ ව්‍යාපෘති සංවර්ධනය**

මෙම අමාත්‍යාංශය හඳුනාගත් සංචාරක යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභා, දිස්ත්‍රික් ලේකම්වරුන් සහ රාජ්‍ය ආයතන සමඟ එක්ව කටයුතු කරමින් සිටී.
විස්තර පහත පරිදි වේ. වගුව 2.4

| අ.අ. | ව්‍යාපෘතියේනම | මුළු ඇස්තමේන්තුගත වියදම (රු.මිලි.) | 2018.12.31 දක්වා වියදම (රු.මිලි.) | 2018.12.31 දක්වා භෞතික ප්‍රගතිය | ක්‍රියාත්මක ආයතනය |
|---|---|---|---|---|---|
| | **අනුරාධපුර දිස්ත්‍රික්කය** | | | | |
| 1 | නුවර වැව් බැම්මේ පයින් ගමන්කරන්නන් සහ පාපැදිකරුවන් සඳහාමංතීරුවක් ඉදි කිරීම | 2.80 | 2.80 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම්, උතුරු මැද පළාත් සභාව |
| 2 | ඉසුරුමුණි විහාරයේ සනීපාරක්ෂක පහසුකම් | 10.28 | 10.28 | වැඩ අවසන් කර | ප්‍රධාන ලේකම් උතුරු මැද පළාත් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | පද්ධතිය ඉදි කිරීම | | | ඇත | සභාව |
| 3 | කුට්ටම් පොකුණ සහ සමාධි පිළිමය අතර වාහන නැවතුම ආසන්නයේ සනීපාරක්ෂක පහසුකම් පද්ධතිය ඉදි කිරීම- අනුරාධපුරය | 7.03 | 7.03 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් උතුරු මැද පළාත් සභාව |
| | **උප එකතුව** | **20.11** | **20.11** | | |
| | **පොළොන්නරුව දිස්ත්‍රික්කය** | | | | |
| 4 | මැදිරිගිරිය වටදාගෙය අසල පොකුණ අවට සංවර්ධනය කිරීම- පොළොන්නරුව | 13.43 | 13.43 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් උතුරු මැද පළාත් සභාව |
| | **උප එකතුව** | **13.43** | **13.43** | | |
| | **පුත්තලම දිස්ත්‍රික්කය** | | | | |
| 5 | ආරච්චිකට්ටුව විවේක ස්ථානය වටා වැට සකස් කිරීම - පුත්තලම | 5.67 | 5.65 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් වයඹ පළාත් සභාව |
| 6 | අංගම්පිටිය හන්දිය සිට අලුත්තොට හන්දිය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | 0.77 | 0.599 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් වයඹ පළාත් සභාව |
| 7 | කම්මල පාලම සිට වෙරළ දක්වා සංවර්ධනය කිරීම | 1.55 | 1.25 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් වයඹ පළාත් සභාව |
| 8 | මානවේරිය විවේක කාමරය අසල මාර්ගය සහ වාහන නැවතුම සංවර්ධනය කිරීම | 5.52 | 4.63 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් වයඹ පළාත් සභාව |
| 9 | වෛක්කාල ප්‍රදේශයේ ට්‍රාන්ස්ෆෝමරයක් සවි කිරීම - පුත්තලම | 4.58 | 4.58 | ක්‍රියාත්මකවෙමින් පවතී | ලංකා විදුලිබල මණ්ඩලය |
| 10 | පුත්තලම වෙරළ උද්‍යානය සංවර්ධනය කිරීම | 9.14 | 8.66 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් වයඹ පළාත් සභාව |
| 11 | ඉරණවිල වෙරළ සංවර්ධනය කිරීම | 0.06 | 0.06 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් වයඹ පළාත් සභාව |
| 12 | කල්පිටිය තුරෙයිඅඩි මාර්ගය සංවර්ධනය කිරීම | 33.52 | 11.40 | ක්‍රියාත්මකවෙමින් පවතී -52% | දිස්ත්‍රික් ලේකම් වයඹ පළාත් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| | උප එකතුව | **60.81** | **36.83** | | |
| | **මහනුවර දිස්ත්‍රික්කය** | | | | |
| 13 | ගඩලාදෙනිය පූජා භූමියේ පෙරහැර මාවත කාපට් අතුරා සංවර්ධනය කිරීම | 15.43 | 15.43 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් මධ්‍යම පළාත් සභාව |
| 14 | නෙල්ලිගල ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයේ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය | 2.50 | 0.79 | ක්‍රියාත්මකවෙමින් පවතී -40% | ප්‍රධාන ලේකම් මධ්‍යම පළාත් සභාව |
| 15 | ගඩලාදෙණිය රජමහා විහාරස්ථානය ආශ්‍රිතව සංචාරක ආකර්ෂණය ඉහල නැංවීම හා භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම - අදියර 111 - මහනුවර | 7.06 | 7.06 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් මධ්‍යම පළාත් සභාව |
| | උප එකතුව | **24.99** | **23.28** | | |
| | **කෑගල්ල දිස්ත්‍රික්කය** | | | | |
| 16 | බතලේගල පර්වතයආශ්‍රිත සංචාරක පහසුකම් සංවර්ධනය කිරීම | 2.70 | 2.63 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් සබරගමුව පළාත් සභාව |
| 17 | රුවන්වැල්ල පෙතන්ගොඩ කටු උණ පඳුර සහිත ප්‍රදේශය දක්වා පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම | 7.96 | 1.75 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් කෑගල්ල |
| | උප එකතුව | **10.66** | **4.38** | | |
| | **නුවරඑළිය දිස්ත්‍රික්කය** | | | | |
| 18 | හැටන්දූම්රිය ස්ථානය සංවර්ධනය කිරීමසහ සංචාරකයින් සඳහා පහසුකම් සැලසීම | 3.59 | 0.50 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් මධ්‍යම පළාත් සභාව |
| 19 | සංචාරක ආකර්ෂණීය ස්ථානයක් වශයෙන් ග්‍රෙගරිවැව සංවර්ධනය කිරීම - පියවර IV- නුවරඑළිය | 38.18 | 38.18 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් මධ්‍යම පළාත් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 20 | කොත්මලේ මහවැලිමහා සෑය සංවර්ධනය කිරීම - නුවරඑළිය | 43.40 | 10.50 | ක්‍රියාත්මක වෙමින් පවතී | ප්‍රධාන ලේකම් මධ්‍යම පළාත් සභාව |
| 21 | හැටන් දුම්රිය ස්ථානයේ සංචාරක පහසුකම් මධ්‍යස්ථානයක් සඳහා උපකරණ මිලදී ගැනීම | 0.17 | 0.17 | ක්‍රියාත්මක වෙමින් පවතී | ප්‍රධාන ලේකම් මධ්‍යම පළාත් සභාව |
| | **උප එකතුව** | **85.34** | **49.35** | | |
| | **කුරුණෑගල දිස්ත්‍රික්කය** | | | | |
| 22 | ඓතිහාසික යාපහුව පුරාණ රජමහා විහාරය සංචාරක ආකර්ෂණීය ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම | 10.64 | 10.64 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් වයඹ පළාත් සභාව |
| 23 | ඓතිහාසිකරිදී විහාරය සංචාරක ආකර්ෂණීය ස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම | 9.11 | 9.11 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල |
| 24 | අරන්කැලේ භාවනා මධ්‍යස්ථානය ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 5.99 | 5.99 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල |
| 25 | පඬුවස්නුවර පුරා විද්‍යා ස්ථානය සඳහා පුරාවිද්‍යා පුවරු සවිකිරීම | 1.48 | 1.48 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල |
| 26 | රඹඩගල්ල මොනරාගල විහාරය ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 16.51 | 11.14 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල |
| 27 | කට්ටිමහන ශාන්ත ආනා දේවස්ථානයෙහි විවේක ස්ථානයක් ඉදිකිරීම | 21.72 | 6.28 | ක්‍රියාත්මකවෙමින් පවතී -70% | දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල |
| 28 | පාදෙණිය නගරයේ විවේක ස්ථානයක් ඉදිකිරීම | 3.12 | 0.63 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් කුරුණෑගල |
| | **උප එකතුව** | **68.57** | **45.27** | | |
| | **යාපනය දිස්ත්‍රික්කය** | | | | |
| 29 | කීරිමලේ ඇඳුම් මාරු කිරීමේ කාමරය ප්‍රතිසංස්කරණය | 1.77 | 1.77 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් උතුරු පළාත් සභාව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 30 | පොදුවාහන නැවැත්වීමේ පහසුකම් හා අක්කරෙයි වෙරළේ සෙවණ සහිත කුටි ඉදි කිරීම | 2.64 | 2.64 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් උතුරු පළාත් සභාව |
| 31 | මාවට්ටපුරම් කන්දස්වාමි දේවාලයේ වන්දනාකරුවන් සඳහා විවේක ශාලාවක් ඉදිකිරීම | 1.69 | 1.66 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් යාපනය |
| 32 | ඩෙල්ෆ්ට් දූපතේ මනල්තුරෙයි පිහිටි විවේක ස්ථානයේ පහසුකම් වැඩිදියුණු කිරීම සහ ගෘහ භාණ්ඩ සහ උපකරණ සැපයීම. (අදියර-ii) | 1.53 | 1.53 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් උතුරු පළාත් සභාව |
| 33 | කන්තරෝඩායිවිල හා ඒ ආශ්‍රිත ප්‍රදේශය සංචාරක ආකර්ෂණීය ප්‍රදේශයක් ලෙස ඉදි කිරීම | 5.45 | 4.50 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් යාපනය |
| 34 | යාපනය දූපත් ආශ්‍රිතව පාරිසරික සංචාරක මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම (අදියර-ii) | 26.32 | 25.75 | ක්‍රියාත්මකවෙමින් පවතී -90% | දිස්ත්‍රික් ලේකම් යාපනය |
| | **උප එකතුව** | **39.39** | **37.85** | | |
| | **මාතර දිස්ත්‍රික්කය** | | | | |
| 35 | දෙනියාය සත්මහල් ඇල්ල ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම .අදියර I සහ ii (කි.මී. 0.459 ක්වූ පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම) | 3.60 | 2.96 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් දකුණු පළාත් සභාව |
| | **උප එකතුව** | **3.60** | **2.96** | | |
| | **ගාල්ල දිස්ත්‍රික්කය** | | | | |
| 36 | අකුරල වෙරළ තීරයේ සනීපාරක්ෂක පහසුකම් සපයන ජංගමසේවා ඒකකයක් ස්ථාපිත කිරීම | 0.81 | **0.69** | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් දකුණු පළාත් සභාව |
| 37 | අම්බලන්ගොඩ මාදම්පාවිල අභය භූමිය අසළ පාරිසරික සංචාරක පහසුකම් සංවර්ධනය කිරීම සහ ගොඩහේන පාවෙන ජැටි ඉදි කිරීම | 4.43 | 2.01 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් දකුණු පළාත් සභාව |
| | **උප එකතුව** | **5.24** | **2.70** | | |
| | **රත්නපුර දිස්ත්‍රික්කය** | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 38 | බටතොටලෙන දේවගුහාව ආශ්‍රිතව ජලය සැපයීම සහ සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය කිරීම -රත්නපුර | 0.23 | 0.23 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් සබරගමුව පළාත් සභාව |
| 39 | උඩවලව ජාතික උද්‍යානයේ හඳගිරිය පිවිසුම් මාර්ගය මතුපිට (කි.මී.15) කැළය එළි කිරීම සහ සංවර්ධනය කිරීම -රත්නපුර | 1.28 | 1.46 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් සබරගමුව පළාත් සභාව |
| 40 | බෝපත්ඇල්ල ආශ්‍රිතව සංචාරක පහසුකම් සංවර්ධනය කිරීම (ඒකාබද්ධ සැලැස්මක් සකස් කිරීම) | 1.79 | 1.43 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් සබරගමුව පළාත් සභාව |
| 41 | බටතොට ප්‍රවේශ මාර්ගය අසල ඇඳුම් මාරු කරන කාමරය ඉදිකිරීම | 1.00 | 1.00 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් සබරගමුව පළාත් සභාව |
| 42 | කුරුවිටබෝපත් ඇල්ල ආශ්‍රිතව සංචාරක පහසුකම් සංවර්ධනය කිරීම (වාහන නැවතුම්පළ අසල) | 6.01 | | ක්‍රියාත්මක වෙමින් පවතී | ප්‍රධාන ලේකම් |
| | **උප එකතුව** | **10.31** | **4.12** | | |
| | **මඩකලපුව දිස්ත්‍රික්කය** | | | | |
| 43 | එරාවුර් කලපු ප්‍රදේශය අලංකරණය හා ප්‍රවර්ධනය කිරීම -මඩකලපුව | 3.05 | 3.05 | වැඩ අවසන් කර ඇත | ප්‍රධාන ලේකම් නැගෙනහිර පළාත් සභාව |
| 44 | එරාවුර්පත්තු වෙරළ තීරය සංවර්ධනය කිරීම | 9.45 | 9.45 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම්, මඩකලපුව |
| | **උප එකතුව** | **12.50** | **12.50** | | |
| | **බදුල්ල දිස්ත්‍රික්කය** | | | | |
| 45 | රාවනාඇල්ල සංචාරක පහසුකම් සහ නැරඹුම් වේදිකාව සංවර්ධනය කිරීම | 12.01 | | ක්‍රියාත්මක වෙමින් පවතී | ප්‍රධානලේකම් ඌව පළාත් සභාව |
| | **උප එකතුව** | **12.01** | **0.00** | | |
| | **අම්පාරදිස්ත්‍රික්කය** | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 46 | ලහුගලමහුල් මහා විහාරයෙහි මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 3.79 | 1.44 | වැඩ අවසන් කර ඇත | දිස්ත්‍රික් ලේකම් නැගෙනහිර පළාත් සභාව |
| | **උප එකතුව** | **3.79** | **1.44** | | |
| | **මාතලේ දිස්ත්‍රික්කය** | | | | |
| 47 | සීගිරිය හෝටලය හන්දියෙහි සිට දියකැපිල්ල දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 2.49 | 2.48 | ක්‍රියාත්මක වෙමින් පවතී | දිස්ත්‍රික් ලේකම්,මාතලේ |
| | **උප එකතුව** | **2.49** | **2.48** | | |
| | **මුළු එකතුව** | **373.24** | **256.90** | | |

**විශේෂ අවස්ථා**



මහනුවර නෙල්ලිගල සනීපාරක්ෂක පහසුකම්



අම්පාර,ලාහුගල මහුල්මඩු විහාරයසංවර්ධනය



යාපනය කන්තොරඩෙයි සංචාරක ස්ථාන ඉදිකිරීම



මහනුවර, ගඩලාදෙණිය පෙරහැර මාර්ගය සංවර්ධනය



රුවන්වැල්ල,පෙතන්ගොඩ කටු උණ පදුරු වෙත යන ප්‍රවේශ මාර්ගය සංවර්ධනය



කුරුණෑගල විවේක ස්ථානඉදිකිරීම



යාපනය,කීරමලෙයි විවේක කාමර සංවර්ධනය කිරීම



මනවේරිය විවේක කාමර අසල රථවාහන නැවතුම්පොළසංවර්ධනය කිරීම



ගොඩහේන පහසුකම් මධ්‍යස්ථානය අම්බලන්ගොඩ, ගාල්ල

## 2.5.2. ප්‍රජා සත්කාරක ගම්මාන වැඩසටහන

### පසුබිම

ප්‍රජා සත්කාරක ගම්මාන වැඩසටහන සම්ප්‍රදායික ශ්‍රී ලාංකික ගැමි ජීවන රටාව තුල රැදෙමින් ස්වභාව සෞන්දර්ය, කෘෂි සහ වෙරළ ආශ්‍රිත විශිෂ්ට සංචාරක අත්දැකීම් ලබා ගැනීමට මංපෙත් විවර කර දෙමින්, එකී මූලික චින්තනය අනුව ක්‍රියාත්මක කරනු ලබයි.

ප්‍රජා සංචාරක නිවාසවල නවාතැන් ගන්නා සංචාරකයින්ට දේශීය සංස්කෘතිය තුල ගොඩනැගුණු හුරුපුරුදු සහ වටිනාකම් ඇතුලත් පවුල් සංස්කෘතීන් අත්විදිමින් තම කාලය ගුණාත්මකව ගත කිරීමට අවස්ථාව උදාවන අතර ගැමි ජීවන රටාව තුල අන්තර්ගත රිද්මය සහ රස විදීමද නොඅඩුව ලබා ගත හැකිය. මෙම ප්‍රජා සත්කාරක නිවාස මඟින් අනන්‍ය වූ දේශීය අත්දැකීම් ලබා ගැනීමට අමතරව සත්කාරක සේවා සපයන පවුල සමඟ අන්‍යෝන්‍ය සබඳතා ඇතිකර ගැනීමටද හැකියාව ඇත. එමඟින් මෙතෙක් අනාවරණය නොවූ නව ස්ථාන අත්විදීමට අවස්ථාව ඇති බැවින් එම ස්ථාන අත්විදීමට අවස්ථාව ඇති බැවින් එම ස්ථාන රජය මඟින් සංචාරක ගමනාන්ත ලෙස ප්‍රචලිත කිරීමෙන් ග්‍රාමීය ජනතාවට විකල්ප ආදායම් මාර්ගයක් සපයාදීමට හැකිවනු ඇත.

### භෞතික ප්‍රගතිය

ප්‍රවර්තන මූල්‍ය වර්ෂය තුළදී, අමාත්‍යාංශය විසින් ධාරිතා සංවර්ධනය කිරීමේ වැඩසටහන් පහක්, උපකරණ සහිත පිළිගැනීම් මධ්‍යස්ථාන දෙකක්, ප්‍රවර්ධන අත්පොත්, සංඥා පුවරු සවිකිරීම, ගම්මානවල පිළිගැනීමේ පුවරු සවිකිරීම, වීඩියෝ දර්ශන පට සහ වෙබ් අඩවි සංවර්ධනය කිරීම සඳහා මූල්‍ය පහසුකම් සපයනු ලැබීය

**මූල්‍ය කාර්යසාධනය**

| | |
|---|---|
| 2018 වර්ෂය සඳහා අනුමත අයවැය | රු.මි.10 |
| 2018.12.31 දක්වා වියදම | රු.මි.2.19 |

**ප්‍රධාන අභියෝග**

- ප්‍රජා සත්කාරක නිවාස සංකල්පය පිළිබඳව ප්‍රජා දැනුවත්භාවය හිඟවීම
- පළාත් සහ ජාතික මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතන අතර අන්තර් පුද්ගල සම්බන්ධීකරණය හීනවීම
- ව්‍යාපෘති ප්‍රචාරණ ක්‍රියාකාරකම් වල අඩු ක්‍රියාකාරිත්වය




මධ්‍යම පළාතේ හීල්ඔය ප්‍රජා සත්කාරක ගම්මානය




දකුණු පළාතේ ගොඩහේන ප්‍රජා සත්කාරක ගම්මානය



වයඹ පළාතේ යාපහුගම ප්‍රජා සත්කාරක ගම්මානය

## 2.5.3. සංචාරක මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම

උපාය මාර්ගික මානව සම්පත් කළමනාකරණය භාවිතා කරන,ඉහළ මට්ටමේ පුහුණු ශ්‍රම බලකායක් සහිත සංචාරක ක්ෂේත්‍රයක් නිවැරදි රැකියාවක් සඳහා නිවැරදි පුද්ගලයින් ආකර්ෂණය කර ගැනීම සඳහා පූර්ව අවශ්‍යතාවක් වේ. ශ්‍රී ලංකාව ඉහළ වටිනාකමකින් යුත් ගමනාන්තයක් බවට පත්වීම සඳහා මෙය අතිශය වැදගත්වේ. සංචාරක හා සත්කාරක සේවා ක්ෂේත්‍රයේ දැවැන්ත වර්ධනයක් මඟින් රැකියා අවස්ථා හා වෘත්තීය අවස්ථා ඇති කරවන අතර ශ්‍රී ලාංකිකයන්ගේ නෛසර්ගික ආගන්තුක සත්කාරක ගුණාංගය ද වර්ධනය කර ගත හැකිය.

**ත්‍රෛමාසික සත්කාරක සේවා පුහුණු වැඩසටහන**

2018 වර්ෂයේ දී රැකියා විරහිත තරුණ තරුණියන් 2200 ක් සත්කාරක සේවා අංශයේ පුහුණු කිරීම සඳහා රුපියල් මිලියන 36.5 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරන ලදී. මෙම සත්කාරක සේවා පිළිබඳ පුහුණු වැඩසටහන් පළාත් සභා, පෞද්ගලික හෝටල් පාසල් හා පුද්ගලික හෝටල්වල සහයෝගිතාවෙන් ක්‍රියාත්මක කර ඇත. මෙය අමුත්තන් පිළිගැනීමේ කළමනාකරණය, ආපනශාලා සේවා කළමනාකරණය හා ගෘහ පාලන කළමනාකරණය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවකින් සමන්විත පාඨමාලාවකි. තවද මෙම පාඨමාලාව මඟින් ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් ඉංග්‍රීසි කතාව, ජීවන කුසලතා, යහපත් සන්නිවේදනය, සිල්ලර වෙළෙඳාම හා පාරිභෝගික සේවා පිළිබඳ පුළුල් දැනුමක් ලබාදේ. මෙහි විෂය මාලාව ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණය ආයතනය (SLITHM) විසින් සකස් කරන ලද අතර ඇගයීම හා විභාගද එම ආයතනය විසින්ම සිදුකරන ලදී.

සිසුන්ට වටිනාකම් එකතු කළ පුහුණුවක් මෙන්ම වෘත්තීය සංවර්ධනය පිළිබඳව මාර්ගෝපදේශනයක් ද ලබා දෙන ලදී.මෙහි සහතිකපත්‍රප්‍රදානය කිරීමේ උත්සවය අමාත්‍යාංශය විසින් පවත්වන ලදි. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණය ආයතනය විසින් නිකුත්කරන පිළිගැනීමේ සහතිකය හෝටල් ක්ෂේත්‍රයේ දේශීය හා විදේශීය රැකියා අවස්ථා පහසුවෙන් ලබාගැනීමට උපකාරී වේ.

**අරමුණු:-**

1. හොඳින් පුහුණුවලත් සේවකයින් සමඟ සත්කාරක සේවා කර්මාන්තයට අවශ්‍ය ශිල්පීන් සැපයීම.
2. සත්කාරක සේවා කර්මාන්තයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම.
3. රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා රැකියා අවස්ථා ලබා දීම.
4. ආගන්තුක සත්කාර පුහුණුව සඳහා කාන්තා සහභාගීත්වය දිරිගැන්වීම සහ ඔවුන්ගේ ආදායම ඉහළ නැංවීම.

**ජයග්‍රහණය :-(2018.12.31 දක්වා)**

- ආපනශාලා සේවා පිළිබඳව තරුණ තරුණියන් 1724 ක් පුහුණු කරන ලදී.
- ගෘහ කළමනාකරණය පිළිබඳව තරුණ තරුණියන් 252 ක් පුහුණු කරන ලදී.
- අමුත්තන් පිළිගැනීමේ කළමනාකරණය පිළිබඳව තරුණ තරුණියන් 231 ක් පුහුණු කරන ලදී.

**ත්‍රෛමාසික සත්කාරක සේවා පුහුණු වැඩසටහනේ සාරාංශයක්-(2018.12.31)** වගුව 2.5

| | පළාත | පාඨමාලාව | | | | මුළු බැදීම්(රු.මි) | 2018.12.31 දක්වා සත්‍ය වියදම (රු.මි) |
|---|---|---|---|---|---|---|---|
| | | ආපනශාලා සේවය | ගෘහ පාලනය | පෙරටු කාර් යාල | එකතුව | | |
| 1 | සබරගමුව | 40 | 0 | 40 | 80 | 1.20 | 8.25 |
| 2 | දකුණු | 95 | 55 | 40 | 190 | 2.85 | 2.34 |
| 3 | උතුරු මැද | 662 | 177 | 0 | 839 | 12.585 | 12.345 |
| 4 | උතුරු | 37 | 0 | 40 | 77 | 1.155 | 0.96 |
| 5 | නැගෙනහිර | 41 | | | 41 | 0.615 | 0.615 |
| 6 | මධ්‍යම | 184 | 0 | 0 | 184 | 2.76 | 2.325 |
| 7 | බස්නාහිර | 445 | 0 | 111 | 556 | 8.34 | 7.725 |
| 8 | වයඹ | 220 | 20 | 0 | 240 | 3.60 | 3.48 |
| | පරිපාලන වියදම් | | | | | | 2.066 |
| | එකතුව | **1724** | **252** | **231** | **2207** | **33.105** | **32.68** |

*මූලාශ්‍රය:* සංචාරක සංවර්ධන,වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය





**ත්‍රෛමාසික සත්කාරක සේවා පුහුණු වැඩසටහනේ සහතිකපත් ලබාදීමේ උත්සවය -2018**





**සංචාරක සේවා සපයන්නන් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන**

මෙම අමාත්‍යාංශය මඟින් දිවයින පුරා සංචාරක ක්ෂේත්‍රයේ සේවා සැපයුම්කරුවන්ගේ හැකියා වර්ධනය කිරීම සඳහා සංචාරක මානව ප්‍රාග්ධන සංවර්ධන වැඩසටහන යටතේ තෙදින පුහුණුවක් පැවැත්වීම ආරම්භ කර ඇත.
විශ්වවිද්‍යාල ආචාර්යවරුන් විසින් සංචාරක සේවා සපයන්නන් සඳහා වන හැකියා වර්ධන වැඩසටහන පළාත් සංචාරක ආයතන සමඟ එක්ව පවත්වනු ලැබේ. මෙම පුහුණු වැඩසටහන සඳහා රු.මි. 3.5ක් වෙන් කර ඇත. සේවා සපයන්නන් 1,500 ක් පුහුණු කිරීමට අපේක්ෂා කරන ලදි.
සංචාරක සේවා සපයන්නන්ගේ හැසිරීම් හා සේවා කුසලතාවෙන් වැඩිදියුණු කිරීමේ අරමුණු සපුරා ගැනීම සඳහා මෙම වැඩසටහන සකස් කරන ලදී.
**ඉලක්ක කණ්ඩායම:**

ප්‍රවාහන පහසුකම් සපයන්නන් (කුළී රථ රියදුරන්, පුද්ගලික ප්‍රවාහන සේවා සපයන්නන්); සංචාරක සාප්පු හිමිකරුවන්, කළමනාකරුවන්, වෙළඳුන්; කුඩා හා ක්ෂුද්‍ර නවාතැන් සපයන්නන් (ආගන්තුක නිවාස හිමියන්, සත්කාරක නිවාස හිමියන්, තරුණ නේවාසිකාගාර ක්‍රියාකරුවන්, සහ වීදි, නගර සහ විශේෂ ස්ථානවල සංචාරක වෙළෙන්දන්).

**අරමුණු**

1. සංචාරක කර්මාන්තය සඳහා බිම් මට්ටමේ සංචාරක පාර්ශවකරුවන් අතර ඇතිවන වෙනස්කම් ඉවත් කිරීම
2. සංචාරක කර්මාන්තයේ ව්‍යාප්තිය වැඩිදියුණු කිරීම හා එමඟින් රටේ පවත්නා හා නැඟී එන ප්‍රදේශවල තරුණ තරුණියන් සඳහා ඇති අවස්ථාවන් වර්ධනය කිරීම
3. සංචාරකයන්ගේ සංජානනය හා තෘප්තිය ඉහළ නැංවීම සඳහා පහසුකම් හා සංචාරක සේවාවන්ගේ ගුණාත්මක භාවය හා ප්‍රමිතිය වැඩි දියුණු කිරීම

**සංචාරක සේවා සපයන්නන් සඳහා ධාරිතා වර්ධන වැඩසටහන (තෙදින)-2018** **වගුව- 2.6**

| පළාත | වෙන්කිරීම (රු.මි) | වියදම(රු.මි) | පුහුණු කරන ලද සංචාරක සේවා සපයන්නන් සංඛ්‍යාව |
|---|---|---|---|
| බස්නාහිර පළාත | 0.79 | 0.511 | 210 |
| දකුණු පළාත | 0.3 | 0.172 | 40 |
| උතුරු පළාත | 0.27 | 0.219 | 100 |
| උතුරු මැද පළාත | 0.53 | 0.147 | 70 |
| මධ්‍යම පළාත | 0.53 | 0.486 | 209 |
| වයඹ පළාත | 0.27 | 0.252 | 135 |
| **මුළු එකතුව** | **2.75** | **1.787** | **764** |

*මූලාශ්‍රය:* සංචාරක සංවර්ධන,වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

### 2.5.4. සංචාරකයන් වැඩිපුර ගැවසෙන ස්ථාන ආශ්‍රිත දුම්රිය ස්ථාන නවීකරණය කිරීම

ශ්‍රී ලංකාවේ දුම්රියෙන් සංචාරය කිරීම සංචාරකයන්ට ඉතා වික්‍රමාන්විත සංචාරක විකල්පයක් වන අතර එය රටේ ස්වාභාවික සෞන්දර්යය ගවේෂණය කිරීමේ හොඳම මාර්ගයයි. ශ්‍රී ලංකා දුම්රිය සේවය මෙරට සංචාරක කර්මාන්තයේ ශක්තිය වැඩි කිරීම සඳහා විශාල විභවතාවක් දරයි. දුම්රිය යටිතල පහසුකම් ඉතා පැරණි වන අතර සේවාව තරමක් මන්දගාමී වන නමුත් දුම්රිය බොහෝ විට ඉතා දර්ශනීය මාර්ගවල ගමන් කරයි. සමහර අවස්ථාවල දී ඉඩ ඇහිරුණු පටු මාර්ගවල ගමනාගමනයට වඩා දුම්රිය ගමනාගමනය වේගවත්ය. ගරු මුදල් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද 2018 අයවැය කථාවට අනුව සඳහන් කර ඇත්තේ දුම්රිය මඟීන්ට හොඳ අත්දැකීමක් ලබාදීම සඳහා පුද්ගලික අංශය සමඟ එක්ව එහි මුල් වාස්තුවිද්‍යාත්මක අනන්‍යතාව ද ආරක්ෂාකරගනිමින් නානුඔය, කොළඹ කොටුව, ගාල්ල සහ ඇල්ල වැනි ජනප්‍රිය ගමනාන්ත වෙත පහසුවෙන් ප්‍රවේශවීම සඳහා දුම්රිය ස්ථාන නවීකරණය කිරිම තුළින් සංචාරකයින්ට පහසුකම් සලස්වනු ලබන බවයි.

මෙම පසුබිම තුළ, සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයෙන් රුපියල් මිලියන 75 ක ප්‍රතිපාදන වෙන් කරවා ගෙන ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආයතනය බවට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව පත්කර ඇති අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව අවශ්‍ය තාක්ෂණික උපදෙස් සපයනු ලබයි.

**මෙම ව්‍යාපෘතිවල විශේෂ අවස්ථා** වගුව **-2.7**

| අංකය | ව්‍යාපෘති ක්‍රියාකාරකම | වෙන්කිරීම(රු.මි) | වියදම(රු.මි) | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | ඇල්ල දුම්රිය ස්ථානය වැඩිදියුණුකිරීම/නවීකරණය කිරීම | 32.65 | 32.65 | 98% |
| **2** | ගාල්ල දුම්රිය ස්ථානය වැඩිදියුණුකිරීම/නවීකරණය කිරීම | 5.56 | **2.88** | 95% |
| **3** | කොළඹ කොටුව දුම්රිය ස්ථානය වැඩිදියුණුකිරීම/නවීකරණය කිරීම | 10.65 | | |
| | **මුළු එකතුව** | **48.87** | **35.53** | |

*මූලාශ්‍රය:* සංචාරක සංවර්ධන,වනජීවී සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

**ඡායාරූප**














**අභියෝග**

01. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ පුහුණු කම්කරුවන්ගේ / තාක්ෂණ ශිල්පීන්ගේ හිඟය.

02. මෙම වැඩපිළිවෙළ කෙරෙහි තනි හෝ හවුල් වගකීම් සහිත රජයේ ආයතන කිහිපයක් පැවතීම ප්‍රගතිය මන්දගාමී කරයි.

03. ඉදිකිරීම් හා අනෙකුත් සංවර්ධන කටයුතු කඩිනම් කිරීම සඳහා අමාත්‍යාංශය වෙත තාක්ෂණික අංශයක් අවශ්‍ය වේ.

**2.5.5. බළකොටු 06 ක් සංවර්ධනය කිරීම**

මීට වසර 1500 ක පමණ අතීතයකට දිවෙන වෙරළ තීරය පුරා විහිදුණු මූලෝපායික ස්ථානවල පිහිටි බළකොටු 30 ක් ශ්‍රී ලංකාවේ ඇත. සංචාරක නිපැයුම් සංවර්ධනය පිළිබඳ වර්තමානයේ හොඳම භාවිතයන් සමඟ ගැළපෙන පරිදි මන්නාරම, මඩකලපුව, යාපනය, ත්‍රිකුණාමලය, මාතර, පුත්තලම සහ හම්බන්තොට ආදී තෝරාගත් බළකොටු 06ක් සංරක්ෂණය හා නවීකරණය කරන ලදී. මෙම සෑම ස්ථානයක්ම නැරඹීම සඳහා කුඩා යාත්‍රා යොදාගැනීමේ අවස්ථාවක් පවතින හෙයින්, මෙය ශ්‍රී ලංකාවේ වැදගත් සංචාරක අත්දැකීම් වලින් එකක් බවට පත්කල හැක.

එබැවින් , පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හා පෞද්ගලික අංශයේ සහයෝගය ඇතිව ඉහළ වටිනාකමක් සහිත සංචාරක ආකර්ෂණ ස්ථාන ලෙස සංරක්ෂණය කිරීම හා වැඩි දියුණු කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය මඟින් රුපියල් මිලියන 250 ක් වෙන් කර ඇත. යටත් විජිත යුගයේ ලන්දේසි බළකොටු හා ලන්දේසි පිය සටහන්, සංචාරක ආකර්ෂණීය ස්ථාන බවට පරිවර්තනය කිරීමේ ප්‍රථම පියවර ලෙස, මුදල් යහමින් වියදම් කරන සංචාරකයින්ගේ වෙළඳපල පවත්වාගැනීමටත්, ඔවුන් ආකර්ෂණය කර ගැනීම සඳහාත් ගමනාන්ත සංවර්ධනය පිළිබඳ වර්තමානයේ හොඳම භාවිතයන් සමඟ ගැළපෙන පරිදි මෙම ලන්දේසි බළකොටු සංවර්ධනය කිරීම ඉතා වැදගත් වේ. මෙම සංදර්භය තුළ, අමාත්‍යාංශය කල්පිටිය හා මන්නාරම බළකොටු සංරක්ෂණ හා ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කර ඇත.

මෙම අමාත්‍යාංශය මඟින් මන්නාරම බළකොටුව සංරක්ෂණය හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රුපියල් මිලියන 25.63 ක මුදලක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වෙත වෙන්කරදී ඇත.

**එම ක්‍රියාකාරකම් පහත දැක්වේ.**

- කොටුව (කොටු පවුර,උපබද්ධ ගොඩනැගිල්ල, සීනු කුළුණ සහ බැවුම් මඟ)
- ඇතුල්වීමේ ගොඩනැගිල්ල, බන්ධනාගාර ගොඩනැගිල්ල හා බංගලාව සඳහා ගෘහ භාණ්ඩ අලුත්වැඩියා කිරීම සහ සැපයීම
- දිය අගළෙහි රොන්මඩ කැනීම

ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මඟින් දිය අගළෙහි රොන්මඩ කැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කරන ලදි.













**කල්පිටිය බළකොටුව**

කල්පිටිය බළකොටුව වර්තමානයේදී ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අත්පත් කර ගෙන භාවිතා කරනු ලැබේ. ශ්‍රී ලංකා නාවික හමුදාව නැවත ස්ථානගත කිරීම හා කොටුව සංරක්ෂණය හා අලුත්වැඩියාව යන කාරණා සම්බන්ධ ක්‍රියාවලිය, මෙම ස්ථානය ආකර්ෂණීය ස්ථානයක් බවට පත්කිරීමට සමගාමීව සිදු කරනු ලැබේ. ඒ අනුව බළකොටුව සංවර්ධනය කිරීම සඳහා වැඩ සැලැස්ම, ක්‍රියාකාරි සැලසුම් සහ කාල රාමුව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අමාත්‍යාංශයට දැනුම් දිය යුතුය.

බළකොටුවේ සංරක්ෂණ කටයුතු මෙන්ම ශ්‍රී ලංකා නාවික හමුදාව නැවත ස්ථානගත කිරීමේ කටයුතු ද ආරම්භ කිරීමට අපේක්ෂා කරන ලද අතර 2019 ජනවාරි මස දෙවන සතිය වන විටත් නාවික හමුදා කඳවුර බළකොටුව තුළ පිහිටා ඇත.

**අභියෝග**

1. මෙම වැඩපිළිවෙළ කෙරෙහි තනි හෝ හවුල් වගකීම් සහිත රජයේ ආයතනවල බහුලතාව ප්‍රගතිය මන්දගාමී කරයි.
2. සමහර බළකොටුවල වර්තමානයේ දී රජයේ සංවිධාන රැඳී සිටිති. උදා. ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් කල්පිටිය කොටුවද සහ මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මඩකලපුව කොටුව ද අත්පත් කර ගෙන ඇත.
3. විවිධ වූ තේමා මූලික ක්‍රියාමාර්ග යටතේ රටෙහි වඩාත් ප්‍රචලිතව නොමැති සංචාරක ආකර්ෂණ ස්ථාන සංවර්ධනය කිරීම සහ ජනප්‍රිය කිරීම.

## 2.5.6. සංචාරක හිතකාමී "ටුක් ටුක්" වැඩසටහන

**හැඳින්වීම:**

මුදල් අමාත්‍යාංශය මගින් ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශීය සංචාරකයින්ගේ යහපත වෙනුවෙන් පිළිගත් සංචාරක ප්‍රමිතීන්ට අනුව මීටර් සවිකරන ලද කුළී රථ සේවාව හඳුන්වා දීම සඳහා වූ ක්‍රමවේදය යටතේ සංචාරක හිතකාමී ටුක් ටුක් සේවාවේ ත්‍රිරෝද රථ රියදුරන් පුහුණු කිරීම සඳහා රු.මි.50 ක මුදලක් වෙන්කර ඇත. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) විසින් අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහනක් ආරම්භ කරන ලදී.

**ඉලක්ක කණ්ඩායම:**

විදේශීය සංචාරකයන් සඳහා ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක ස්ථානවල ප්‍රවාහන සේවාවන් සපයන ත්‍රිරෝද රථ රියදුරන්

**ක්‍රියාකාරකම්:**

- පුහුණු හා දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීම
- ඇගයීම් පරීක්ෂණ ලෙස විභාග පැවැත්වීම
- සහතික, හැඳුනුම්පත් සහ ස්ටිකර් නිකුත් කිරීම
- ටුක්-ටුක්වෙළඳ නාමකරණය
- දත්ත පද්ධතිය සහ ජංගම යෙදුම සංවර්ධනය කිරීම
- සංචාරක හිතකාමී ටුක් ටුක් සේවාව දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රවර්ධනය කිරීම

**මෙම ව්‍යාපෘතිවල විශේෂ අවස්ථා:**

2018 වසරේ ජාතික අයවැය යෝජනා අනුව, සංචාරකයින්ට ප්‍රවාහන සේවාවන් සපයන සියළුම ත්‍රිරෝද රථ රියදුරන් විධිමත් කිරීමට රජය තීරණය කළේය. ඒ අනුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) විධිමත් පුහුණු වැඩසටහනක් තුළින් ත්‍රිරෝද රථ රියදුරන් විසින් සපයනු ලබන සේවාවන්ගේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමට සැලසුම් කරයි. එබැවින්, බස්නාහිර පළාතේ ප්‍රතිලාභීන් 813 ක්, දකුණු

පළාතේ ප්‍රතිලාභීන් 78 ක් සහ සබරගමුව පළාතේ ප්‍රතිලාභීන් 125 ක් සඳහා පුහුණු වැඩසටහන් හතක් පවත්වන ලදී.

**2.5.7.ඉහළ සංචාරක ආකර්ෂණයක් සහිත ප්‍රදේශවල සංචාරක පොලිසි ව්‍යාප්ත කිරීම**

2018 වාර්ෂික අයවැය යෝජනා වලට අනුව ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩ සටහන යටතේ දිවයින පුරා හඳුනාගෙන තිබුණු ප්‍රදේශ 17 ක් අතුරින් ඇල්ල, මිරිස්ස හා කල්පිටිය යන ප්‍රදේශ සඳහා ප්‍රමුඛත්වය ලබාදී නව සංචාරක පොලිස් ඒකක 03 ක් 2018 වර්ෂයේදී ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා එක්ව කටයුතු ආරම්භ කරන ලදී.

නව සංචාරක පොලිස් ඒකක ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ඉඩකඩම් පවරාගැනීමේ හා නිරවුල් කරගැනීමේදී පවත්නා දුෂ්කරතාවන්ට විකල්පයක් වශයෙන් අවම ඉඩ ප්‍රමාණයක් සහිතව කන්ටේනර් පෙට්ටි භාවිත කර පොලිස් ස්ථාන ගොඩනැගීමේ නියමු ව්‍යාපෘතියක් ලෙස මිරිස්ස ප්‍රදේශයේ නව පොලිස් ඒකකයක් පිහිටුවීමේ කටයුතු ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ආරම්භ කරන ලද අතර එම කටයුතු මේ වන විට නිමවෙමින් පවතී.

ඇල්ල ප්‍රදේශයේ හඳුනාගත් රජය සතු ඉඩමක ස්ථාවර සංචාරක පොලිස් ඒකකයක් පිහිටුවීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි සැලසුම් හා වැය ඇස්තමේන්තු සකස්කර අවසන්ව ඇති අතර උක්ත ඉඩම නිරවුල් කරගැනීමේ කටයුතු අවසන් වූ වහාම වැඩ ආරම්භ කිරීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත බලය පවරා ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් කල්පිටිය ප්‍රදේශයේ හඳුනාගත් රජය සතු ඉඩමක ස්ථාවර සංචාරක පොලිස් ඒකකයක් පිහිටුවීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි සැලසුම් සකස්කර ඉඩම් නිරවුල් කරගැනීමේ කටයුතුද අවසන් කර ඇති අතර, ගොඩනැගිලි ඉදිකිරීම සඳහා වන ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබේ.

**2.5.8. මන්නාරම මඩු දේවස්ථානයේ සංක්‍රමණ නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීම**

මෙම අමාත්‍යාංශය මන්නාරම මඩු දේවස්ථානය නැරඹීමට පැමිණෙන සංචාරකයින් සහ වන්දනාකරුවන් සඳහා ඉන්දියානු රජයේ අනුග්‍රහයෙන් සංක්‍රමණ නිවාස ව්‍යාපෘතියක් එහි ඉදිකිරීම ආරම්භ කර ඇත.

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය හා මෙම අමාත්‍යාංශය අතර මේ සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමක් (MoU) දැනටමත් අත්සන් කර ඇත. තවද, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව උපදේශන සේවා සැපයීම සඳහා එකඟවී ඇති අතර එම දෙපාර්තමේන්තුව සමඟද අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියද ලබා ගන්නා ලදී. කෙසේ වෙතත්, මඩු දේවස්ථානය පිහිටි ප්‍රදේශය පූජාභූමියක් ලෙස අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රකාශයට පත්කර ඇති හෙයින්, පූජාභූමිය සංවර්ධනය කිරීම සඳහා ප්‍රධාන සැලැස්මක් පිළියෙල කිරීම සඳහා ජාතික භෞතික සැළසුම් දෙපාර්තමේන්තුව (NPPD) විසින් පියවර ගෙන ඇත. ඒ අනුව,ජාතික භෞතික සැළසුම් දෙපාර්තමේන්තුව (NPPD) මෙම ව්‍යාපෘතිය සඳහා අක්කර 6.5 - 7 ක ඉඩමක් වෙන්කරදී ඇත. මෙම

අමාත්‍යාංශය මිනින්දෝරු සැලැස්ම අනුව බිම් කට්ටි කරන ලෙස මඩු ප්‍රාදේශිය ලේකම්වරයාගෙන් ඉල්ලා ඇති අතර ව්‍යාපෘති සැලසුම්, ලංසු ලේඛන සහ ප්‍රමාණ සමීක්ෂණ ආදිය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඇත.

ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලය 2019 ජනවාරි මස පළමු සතිය වන විට සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීම පිණිස ලංසු කැඳවීමේ පුවත්පත් දැන්වීම ප්‍රකාශයට පත් කිරීමට නියමිතව ඇත.

## 2.5.9. අලෙවිකරණ සංවර්ධන පහසුකම් (MDF)

අලෙවිකරණ සංවර්ධන පහසුකම් ව්‍යාපෘතිය යනු සංචාරක සංවර්ධන , වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ අනුග්‍රහය යටතේ ක්‍රියාත්මක කරන ඕස්ට්‍රේලියානු රජය විසින් ආධාර සපයනු ලබන පුද්ගලික අංශ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය 2017 මාර්තු මාසයේදී නිල වශයෙන් ආරම්භ කරන ලදි.

ප්‍රගතිය පහත පරිදි වේ.

# පරිච්ඡේදය 3

# මූලාය ප්‍රගතිය

# 3. මූල්‍ය ප්‍රගතිය –2018 (සංචාරක අංශය)

## 3.1 විසර්ජන පනත අනුව මුළු ප්‍රතිපාදන සහ එහි භාවිතය – 2018

වගුව:3.1

**ශීර්ෂ අංක: 159**

**රු.'000**

| විස්තරය | වැඩසටහන – 01 මෙහෙයුම් ක්‍රියාකාරකම් | | | | වැඩසටහන – 02 සංවර්ධන ක්‍රියාකාරකම් | | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යාපෘතිය– 01 අමාත්‍ය කාර්යාලය | | ව්‍යාපෘතිය – 02 පරිපාලන සහ ආයතනික සේවා | | ව්‍යාපෘතිය – 03 සංචාරක ප්‍රවර්ධනය | | | |
| | මුළු ප්‍රතිපාදනය | සත්‍ය වියදම | මුළු ප්‍රතිපාදනය | සත්‍ය වියදම | මුළු ප්‍රතිපාදනය | සත්‍ය වියදම | ප්‍රතිපාදනය | සත්‍ය වියදම |
| <u>පුනරාවර්තන</u> | | | | | | | | |
| • පුද්ගල පඩිනඩි | 23,065 | 16,515 | 38,465 | 38,232 | - | - | 61,530 | 54,747 |
| • අනෙකුත් පුනරාවර්තන වියදම් | 22,085 | 17,566 | 54,425 | 46,723 | 300,000 | - | 376,510 | 64,289 |
| උප එකතුව | **45,150** | **34,081** | **92,890** | **84,955** | **300,000** | **-** | **438,040** | **119,036** |
| <u>මූලධන</u> | | | | | | | | |
| 2001 | 707 | 707 | 346 | 346 | - | - | 1,053 | 1,053 |
| 2002 | 400 | 87 | 500 | 87 | - | - | 900 | 174 |
| 2003 | 2,100 | 1,990 | 1,000 | 251 | - | - | 3,100 | 2,241 |
| 2102 | 299 | 299 | 2,251 | 2,234 | - | - | 2,550 | 2,533 |
| 2103 | 17 | 17 | - | - | - | - | 17 | 17 |
| 2401 | - | - | 3,000 | 2,965 | - | - | 3,000 | 3,965 |
| 2202 | - | - | - | - | 470,000 | 290,698 | 470,000 | 290,698 |
| 2506 | - | - | - | - | 325,000 | 39,311 | 325,000 | 39,311 |
| 2509 | - | - | - | - | 50,000 | - | 50,000 | - |
| උප එකතුව | **3,523** | **3,100** | **7,097** | **5,883** | **845,000** | **330,009** | **855,620** | **338,992** |
| මුළු එකතුව | **48,673** | **37,181** | **99,987** | **90,838** | **1,1145,000** | **330,009** | **1,293,660** | **458,028** |

මූලාශ්‍රය: ගිණුම් අංශය, සංචාරක සංවර්ධන,වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

### 3.1.2 සාරාංශය

**මුළු ප්‍රතිපාදන** වගුව:3.2

| විස්තරය | වැඩසටහන – 01 | වැඩසටහන – 02 | එකතුව |
|---|---|---|---|
| | මෙහෙයුම් ක්‍රියාකාරකම් | සංවර්ධන ක්‍රියාකාරකම් | |
| පුනරාවර්තන | 138,040,200 | 300,000,000 | 438,040,200 |
| මූලධන | 10,619,800 | 845,000,000 | 855,619,800 |
| **එකතුව** | **148,660,000** | **1,145,000,000** | **1,293,660,000** |

මූලාශ්‍රය: ගිණුම් අංශය, සංචාරක සංවර්ධන,වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

### 3.1.3. ව්‍යාපෘති අනුව මුළු ප්‍රතිපාදනය වගුව:3.3

රු.000

| ව්‍යාපෘතිය | පුනරාවර්තන (රු.මි.) | මූලධන (රු.මි.) | එකතුව (රු.මි.) |
|---|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | 45,150 | 3,523 | 48,673 |
| පරිපාලන සහ ආයතනික සේවා | 92,890 | 7,097 | 99,987 |
| සංචාරක සංවර්ධන ක්‍රියාකාරකම් | 300,000 | 845,000 | 1,145,000 |
| **එකතුව** | **438,040** | **855,620** | **1,293,660** |

මූලාශ්‍රය: ගිණුම් අංශය, සංචාරක සංවර්ධන,වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

### 3.1.4. මුළු ප්‍රතිපාදන භාවිතය වගුව:3.4

| විස්තරය | ප්‍රතිපාදන (රු.මි.) | උපයෝජනය (රු.මි.) | උපයෝගීතාවය(%) |
|---|---|---|---|
| පුනරාවර්තන–මෙහෙයුම් ක්‍රියාකාරකම් | 138,040,200 | 119,036,945 | 86.23 |
| - සංවර්ධන ක්‍රියාකාරකම් | 300,000,000 | - | - |
| මූලධන–මෙහෙයුම් ක්‍රියාකාරකම් | 10,619,800 | 8,982,164 | 84.58 |
| - සංවර්ධන ක්‍රියාකාරකම් | 845,000,000 | 330,009,182 | 39.05 |
| එකතුව | **1,293,660,000** | **458,028,291** | **35.40** |

මූලාශ්‍රය: ගිණුම් අංශය, සංචාරක සංවර්ධන,වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

### 3.1.5. වත්කම් කළමනාකරණය

වත්කම් කළමනාකරණය හා ගණන්තැබීම, අදාල රෙගුලාසි වලට අනුව සිදුවන අතර 2018 දෙසැම්බර් 31 වන දිනට අත්පත් කරගැනීම් වල මුළු වටිනාකම රු. 167,242,898 කි. අදාල විස්තර පහත පරිදි වේ.

වගුව :3.5

| විස්තරය | ප්‍රමාණය (රු.) |
|---|---|
| වාහන | 149,093,846 |
| කාර්යාලීය උපකරණ | 2,562,437 |
| පරිගණක උපාංග | 9,428,371 |
| ඉලෙක්ට්‍රොනික උපකරණ | 216,929 |
| සන්නිවේදන උපකරණ | 2,166,108 |
| ගෘහභාණ්ඩ | 3,775,207 |
| **එකතුව** | **167,242,898** |

මූලාශ්‍රය: ගිණුම් අංශය, සංචාරක සංවර්ධන,වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

### 3.1.6. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

**2018 විසර්ජන පනත අනුව රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ සීමාවන් සහ එහි වාර්ෂික ප්‍රගතිය** වගුව 3.6

| විස්තරය | අනුමත සීමාව (රු.) | වර්ෂ අවසාන ප්‍රගතිය (රු.) |
|---|---|---|
| උපරිම හර සීමාව | 3,000,000 | 2,687,339 |
| අවම බැර සීමාව | 1,000,000 | 1,960,240 |
| උපරිම හර ශේෂ සීමාව | 10,000,000 | 9,530,158 |

මූලාශ්‍රය: ගිණුම් අංශය, සංචාරක සංවර්ධන,වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

### 3.1.7. වර්ෂය තුල නිකුත් කල අත්තිකාරම් සහ ණය පිළිබඳ විස්තරය පහත පරිදිවේ.

වගුව: 3.7

| **ණය වර්ගය** | **ප්‍රමාණය (රු.)** |
|---|---|
| ආපදා ණය | 2,088,183 |
| උත්සව අත්තිකාරම් | 350,000 |
| විශේෂ අත්තිකාරම් | 72,000 |
| දේපල ණය | 177,156 |
| **එකතුව** | **2,687,339** |

මූලාශ්‍රය: ගිණුම් අංශය, සංචාරක සංවර්ධන,වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

## 3.2. මූල්‍ය ප්‍රගතිය -2018 (වනජීවී අංශය)

## 3.2.1. මූල්‍ය ප්‍රගතිය සාරාංශය -2018.12.31 දිනට

වගුව .38

| අරමුදල් මූලාශ්‍රය | ප්‍රතිපාදන (රු.මි.) | වියදම (රු.මි.) | (%) |
|---|---|---|---|
| මූලධන වියදම් | 852.00 | 844.94* | 99 |
| පුනරාවර්තන වියදම් | 192.25 | 151.08 | 78.5 |
| **මුළු ප්‍රතිපාදන හා වියදම** | **1044.25** | **996.02** | **95** |

අතැති බිල් සමග *

මූලාශ්‍රය : වනජීවී අංශය - ගිණුම් අංශය

## 3.2.2. ව්‍යාපෘති අනුව මූල්‍ය ප්‍රගතිය – 2018

වගුව 3.9

| වැය විෂයය | වැය විස්තරය | 2018 ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (රු.) | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු.) | වියදම (රු.) | ඉතිරිය (රු.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|---|---|
| | එකතුව | **192,250,000** | **192,250,000** | **151,203,941.54** | **41,046,058.46** | **79** |
| 1001 | වැටුප් හා දීමනා | 58,000,000 | 58,000,000 | 42,545,251.49 | 15,454,748.51 | 73 |
| 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 6,000,000 | 5,250,000 | 4,657,578.69 | 592,421.31 | 89 |
| 1003 | වෙනත් දීමනා | 23,000,000 | 23,000,000 | 18,349,867.62 | 4,650,132.38 | 80 |
| 1101 | දේශීය ගමන් වියදම් | 1,800,000 | 1,800,000 | 901,777.89 | 898,222.11 | 50 |
| 1102 | විදේශීය ගමන් | 5,000,000 | 8,000,000 | 6,694,433.41 | 1,305,566.59 | 84 |
| 1201 | ලිපිද්‍රව්‍ය | 3,600,000 | 3,600,000 | 2,591,415.68 | 1,008,584.32 | 72 |
| 1202 | ඉන්ධන | 13,700,000 | 10,260,000 | 9,160,907.70 | 1,099,092.30 | 89 |
| 1203 | ආහාර පාන හා නිල ඇඳුම් | 190,000 | 72,000 | 72,000.00 | 0.00 | 100 |
| 1205 | වෙනත් | 2,000,000 | 2,000,000 | 888,088.11 | 1,111,911.89 | 44 |
| 1301 | වාහන | 8,700,000 | 8,700,000 | 8,314,388.08 | 385,611.92 | 92 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2,200,000 | 2,200,000 | 1,041,383.00 | 1,158,617.00 | 47 |
| 1303 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 800,000 | 800,000 | 73,690.00 | 726,310.00 | 9 |
| 1401 | ප්‍රවාහන | 6,200,000 | 6,600,000 | 6,290,755.16 | 309,244.84 | 95 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 3,700,000 | 4,050,000 | 3,087,861.52 | 962,138.48 | 76 |
| 1403 | විදුලිය හා ජලය | 260,000 | 378,500 | 309,538.77 | 68,961.23 | 82 |
| 1404 | කුලී හා දේශීය බදු | 52,000,000 | 52,000,000 | 40,987,695.11 | 11,012,304.89 | 79 |
| 1409 | වෙනත් | 4,500,000 | 5,100,000 | 4,820,211.82 | 279,788.18 | 95 |
| 1506 | රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | 500,000 | 339,500 | 334,777.49 | 4,722.51 | 99 |
| 1703 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 100,000 | 100,000 | 82,320.00 | 17,680.00 | 82 |
| | එකතුව | **852,000,000** | **852,000,000** | **434,653,773.02** | **417,346,226.98** | **51** |
| 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1,500,000 | 1,5000,000 | 988,918.96 | 511,081.04 | 66 |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,500,000 | 1,500,000 | 141,914.35 | 1,358,085.65 | 9 |
| 2003 | වාහන | 4,000,000 | 4,000,000 | 3,975,335.72 | 24,664.28 | 99 |
| 2101 | වාහන | 500,000,000 | 262,000,000 | 261,909,200.00 | 90,800.00 | 100 |
| 2102 | ලී බඩු හා කාර්යාල උපකරණ | 2,500,000 | 1,022,000 | 1,020,555.52 | 1,444.48 | 100 |
| 2401 | කාර්යය මණ්ඩල පුහුණු | 1,000,000 | 1,200,000 | 1,190,370.60 | 9,629.40 | 99 |
| 1 2501 | තිරසර සංවර්ධනය | 40,000,000 | 18,239,000 | 17,083,951.95 | 1,155,048.05 | 94 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 2 2501 | උතුරු පළාත් සංවර්ධන වැඩසටහන | 10,00,000 | 672,000 | 671,587.00 | 413.00 | 100 |
| 3 2501 | පුත්තලම සංවර්ධන වැඩසටහන | 11,500,000 | 6,300,000 | 3,210,851.38 | 3,089,148.62 | 51 |
| 4 2509 | වඳ වී යෙනයාමේ තර්ජනයට මුහුණපා ඇති සත්ත්ව හා ශාක විශේෂ සම්බන්ධ අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ සම්මුතිය (CITES) වැඩසටහන | 250,000,000 | 555,074,000 | 143,996,099.30 | 411,077,900.70 | 26 |
| 2501 5 | අමාත්‍යාංශය ජාලගත කිරීම | 30,000,000 | 493,000 | 464,988.24 | 28,011.76 | 94 |
| | **එකතුව** | **1,044,250,000** | **1,044,250,000** | **585,857,714.56** | **458,392,285.44** | **56** |

මූලාශ්‍රය : වනජීවී අංශය - ගිණුම් අංශය

## 3.2.3 වත්කම් කළමනාකරණය

වගුව .310

| **විස්තරය** | **මුදල (රු.)** |
|---|---|
| **ජංගම නිවාස** | 1,896,350 |
| මගී වාහන | 210,036,502 |
| කාර්යාල උපකරණ | 416,820 |
| පරිගණක උපාංග | 6,308,920 |
| විදුලි උපකරණ | 4,439,649 |
| සන්නිවේදන උපකරණ | 2,047,942 |
| ගෘහභාණ්ඩ | 6,372,980 |
| වාර ප්‍රකාශන | 4,538 |
| වෙනත් මූල්‍ය නොවන වත්කම් | 138,931 |
| **එකතුව** | **231,662,632** |

මූලාශ්‍රය : වනජීවී අංශය - ගිණුම් අංශය

**රාජ්‍ය සේවකයන්ගේ අත්තිකාරම් බී ගිණුම**

වගුව 3.11

| **විස්තරය** | **අනුමත ප්‍රතිපාදන (රු.)** | **ප්‍රගතිය (රු.)** |
|---|---|---|
| අවම හර සීමාව | 6,000,000 | 5,048,243.00 |
| අවම බැර සීමාව | 2,500,000 | 6,740,101.43 |
| අවම හර සීමාවේ ඉතිරිය | 15,000,000 | 11,393,257.27 |

මූලාශ්‍රය : වනජීවී අංශය - ගිණුම් අංශය

**ණය හා අත්තිකාරම් ගිණුම්වල සාරාංශය — 2018.12.31**

වගුව .312

| **ණය** | **මුදල (රු.)** |
|---|---|
| ආපදා ණය | 4,326,243 |
| උත්සව අත්තිකාරම් | 590,000 |
| විශේෂ අත්තිකාරම් | 132,000 |
| විශේෂ ණය | - |
| **එකතුව** | **5,048,243** |

මූලාශ්‍රය : වනජීවී අංශය - ගිණුම් අංශය

# පරිච්ඡේදය 4

## අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය

# 4. අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය

## 4.1 අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය (සංචාරක)

- අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය 2016 නොවැම්බර් මස අභිනවයෙන් ස්ථාපිත කරන ලද අතර එය මු.රෙ. 134(1) පරිදි අමාත්‍යාංශයේ ලේකම් වෙත වගකියනු ලබන ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. මහා භාණ්ඩාගාරයේ කලමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ මගපෙන්වීම යටතේ වර්ෂය ආරම්භයේ පිළියෙල කරනු ලබන වාර්ෂික විගණන සැලැස්මට අනුව අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ.

- 2018 වර්ෂයට අදාළව අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනයන් සිදු කරන ලද අතර ඒවාට අදාළව අභ්‍යන්තර විගණන වාර්තා 08 ක් නිකුත් කර ඇත.

- පරික්ෂාවේදී හා වාර්තා වලින් පෙනීයන අඩුපාඩු සම්බන්ධව විගණන හා කලමනාකරණ කමිටුවලදී සහ ප්‍රගති රැස්වීමේදී නිලධාරීන් දැනුවත් කර නිවැරදි ක්‍රියාමාර්ග වලට යොමු කරනු ලැබේ.

- 2018 වර්ෂයේ පහත සඳහන් දිනයන්හි විගණන හා කලමනාකරණ කමිටු රැස්වීම් පවත්වන ලදී.

| | |
|---|---|
| 1 වන කාර්තුව | 2018.03.27 |
| 2 වන කාර්තුව | 2018.07.25 /26 |
| 3 වන කාර්තුව | 2018.10.09 |
| 4 වන කාර්තුව | 2018.12.27 |

අමාත්‍යාංශය යටතේ පවතින ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතනවල සියළු ප්‍රධානීන් හා අදාළ නිලධාරීන් මෙම කමිටු රැස්වීම සඳහා කැඳවන ලද අතර ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ආයතන වල වාර්ෂික සැලසුම්වල ප්‍රගතිය හා වාර්තා ඉදිරිපත් කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම හා මූල්‍ය ශික්ෂණය පිළිබඳ අවදානම් අංශ කෙරෙහි පෞද්ගලික අවධානය යොමුකොට නිවාරණ පිළියම් යෙදීමට කටයුතු කෙරේ.

- විගණකාධිපති විගණන විමසුම් සම්බන්ධව සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම හා පිළිතුරු ඉදිරිපත් කිරීම. 2018 වර්ෂයට අමාත්‍යාංශට යොමුකරන ලද විමසුම් 19 ක් වන අතර, 18 කට පිළිතුරු යවා ඇත.

- රාජ්‍ය ගිණුම් කාරක සභා රැස්වීම් හා රාජ්‍ය ව්‍යපාර පිළිබඳ ගිණුම්කාරක සභා රැස්වීම් සම්බන්ධීකරණය කිරීම. 2018 මාර්තු මස පැවති රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීමට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම හා එම නිර්දේශ පිළිබඳව අවශ්‍ය කටයුතු කිරීම.

- මූල්‍ය හා කාර්යසාධනය ඇගයීම සඳහා සකස්කර ඇති පරිගණක තොරතුරු කලමණාකරණ පද්ධතිය මගින් පාර්ලිමේන්තුවට තොරතුරු ඉදිරිපත් කිරීම හා එම වාර්තා සම්බන්ධයෙන් රජයේ ගිණුම්කාරක සභාව එවන ලද නිරීක්ෂණ සම්බන්ධව ත්‍රෛභාෂාවෙන් පිළිතුරු ඉදිරිපත් කිරීම.

- මීට අමතරව විශේෂ විමර්ශන 02 ක් සිදුකර වාර්තා ලබා දී ඇත. අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක විශේෂ විගණනයක් සිදුකිරීම ආරම්භ කර ඇත.

- ප්‍රධාන අභ්‍යන්තර විගණක හා කලමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනකු මෙම අංශයට අනුයුක්තව ඇත.

## 4.2 අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය (වනජීවී)

මුදල් රෙගුලාසි 133 හි දැක්වෙන අභ්‍යන්තර විගණන පරමාර්ථ ඉටුවන පරිදි ස්ථාපිත කර ඇති අභ්‍යන්තර විගණන අංශය අමාත්‍යාංශයේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු පිළිබඳව ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන ක්‍රම වල කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඇගයීම සඳහා නිරන්තර සෝදිසි පරීක්ෂණ සිදු කරනු ලැබේ. වාර්ෂික විගණන සැලැස්ම පරිදි වනජීවීඅංශයේ අභ්‍යන්තර විගණන කටයුතු හා විශේෂ විමර්ශන කටයුතු ඉටුකරන අතරම වනජීවී අංශය යටතට ගැනෙන වනජීවී සංරක්ෂණ , ජාතික උද්භිද උද්‍යාන සහ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් වනජීවී අංශය වෙනුවෙන් විශේෂ පරීක්ෂණ කටයුතු මෙහෙය වීමද සිදුකරනු ලැබේ.

### 2018.12.31 දිනට ප්‍රගතිය

**අභ්‍යන්තර විගණන විමසුම්**

- වාහන නඩත්තුව, අතිකාල ගෙවීම් හා වවුචර් පරීක්ෂාව
- මිලදී ගැනීම්, දුරකතන බිල්පත් ගෙවීම් හා වවුචර් පරීක්ෂාව
- වාහන අනතුරු,විදේශ ගමන්, සේවා ලබාගැනීම් හා වවුචර් පරීක්ෂාව
- මිලදී ගැනීම්, තොග පාලනය හා වවුචර් පරීක්ෂාව
- වවුචර් පරීක්ෂාව
- රජයේ විගණන විමසුම් 08ක් සඳහා පිළිතුරු යැවීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම
- නිලධාරීන්ගේ පැමිණීම පිටවීම පරීක්ෂාව
- වාහන ලිපිගොනු පරීක්ෂාව
- වවුචර් පරීක්ෂාව

**පරීක්ෂණ**

| කාර්තුව | ආයතනය | ඉටු කල කාර්යය |
|---|---|---|
| පළමුවන | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 1. ගල්ඔය ජාතික උද්‍යානයේ උද්‍යාන භාරකරු සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණය<br>2. විල්පත්තු ජාතික උද්‍යානයේ මරදන්මඩුව ආශ්‍රිතව වනජීවීන් පුනරුත්ථාපනය සඳහා මධ්‍යස්ථානයක් ඉදිකිරීමේ පරීක්ෂණය |
| හතරවන | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | මොරගහකන්ද ව්‍යාපෘතිය සඳහා කළුගල් ලබාගත් නාවුල තලංගොඩ පිහිටි ගල්වලෙහි මෙහෙයුම් කටයුතු "පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන 2016 - 2020" යටතේ වන මාර්ග සංවර්ධන වැඩසටහන සඳහා කළුගල් ලබා ගැනීමට අනුමැතිය ලබාදීම. |

**මූලික විමර්ශන**

| | | |
|---|---|---|
| තුන්වන | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | PE-1580දරණ වාහනයේ ඇතිවූ ආපදා තත්වය මත නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ක්ෂේත්‍ර පරීක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් අපහසුතාවට පත්වීම. |
| හතරවන | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | 1.මොරගොඩ බීට්ටු කාර්යාලයට අනුයුක්ත කර ඇති නිලධාරීන් නිසි පරිදි රාජකාරී ඉටු නොකිරීම<br>2.මරද මඩු වන නිවහන ඉදිකිරීමට අදාළව රුපියල් මිලියන පහළොවක මුදලක් වැඩිපුර ගෙවීම.<br>3.කරවිලේ බීට්ටුවේ පනහගල නිදන් හෑරීම.<br>4.ත්‍රිකුණාමලය කලාපයේ සහකාර අධ්‍යක්ෂවරයා සම්බන්ධව ඉදිරිපත් කර ඇති පැමිණිල්ල |

මූලාශ්‍රය : වනජීවී අංශය - අභ්‍යන්තර විගණන අංශය

**විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම**

පළමු කාර්තු රැස්වීම - 2018.04.20

දෙවන කාර්තු රැස්වීම - 2018.07.23

තෙවන කාර්තු රැස්වීම - 2018.10.25

සිව්වන කාර්තු රැස්වීම - 2018.12.05